**ශීර්ෂය 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය **282** - වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 ජූනි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

**1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන්

සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල අවසාන ශේෂය රු.මිලියන 110,269.78 ක් වුවද 2024 ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂය රු.මිලියන 109,672.11 ක් ලෙස රු. මිලියන 597.67 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂ අවසාන මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ (SA-82) ආරම්භක ශේෂය හා 2023 වර්ෂ අවසාන මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ අවසන් ශේෂ අතර රු. මිලියන 597.67 ක වෙනස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ CIGAS වැඩසටහනේ පවතින ගැටළු හේතුවෙන් ඇති වී ඇත. | CIGAS වැඩසටහනේ පවතින ගැටළු නිවැරදි කළ යුතුය. |
| (ii) | දෙපාර්තමේන්තුවේ වත්කම් කළමනාකරණ අංශය මගින් සකස්කර තිබූ වාර්තා වලින් හඳුනාගෙන තිබූ දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි සංඛ්‍යාව 2562 ක් වුවද ගොඩනැගිලි 616 ක වටිනාකම පමණක් 2024 වර්ෂයේ ගිණුම්ගත කර තිබුණ අතර ගොඩනැගිලි 1946 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් එවන ලද තක්සේරු වාර්තා මත පදනම් ව ගොඩනැගිලි සමූහයන්ගේ එකතුවක් වශයෙන් අයිතම 616 ක් සිගාස් ගිණුම්වලට හඳුනාගෙන ඇත. එම හඳුනාගත් ගොඩනැගිලි එකතුන් තුළ ඇති එක් එක් ගොඩනැගිලි ගණන වෙන් වෙන් වශයෙන් මේ වන විට හඳුනා ගනිමින් පවතී. | ගිණුම්වලට ගෙන නොමැති සියලුම ගොඩනැගිලි නිවැරදිව හඳුනාගෙන තක්සේරු කර ගිණුම්වල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (iii) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය ප්‍රකාරව වාරිමාර්ග දෙපාර්තමේන්තුව/ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්/ දෙපාර්තමේන්තු ලිපිනය යටතේ වාහන 1962 ක් ලියාපදිංචි වී තිබුණි. එසේ වුවද කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය හඳුන්වා දී ඇති දත්ත පද්ධතියට 2024 දෙසැම්බර් 31 දිනට ඇතුළත් කර ඇති වාහන සංඛ්‍යාව 1159 ක් හා එදිනට | අදාළ වාහන හා යන්ත්‍ර මෝටර් රථ ප්‍රවාහන නිලධාරියෙකු ඇතුළත් වන කමිටුවක් මඟින් තක්සේරු කර නොමැති බැවින්, අධ්‍යක්ෂ (යාන්ත්‍රික) ID/DM/HQ/01/16/NFAMS හා 2024 මැයි 21 දිනැති ලිපිය මඟින් වාහන තක්සේරු කර තොරතුරු ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී. අදාළ තක්සේරු වාර්තාවක් ලද විගස NFAMS පද්ධතියට තොරතුරු යාවත්කාලීන කර අදාළ වටිනාකම් සිගාස් ගිණුම් පද්ධතියට ඇතුලත් කර ගැනීමට | සියලුම වාහන සම්බන්ධව ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු අතර දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගත යුතුය. ලිපිගොනු සොයාගත නොහැකි වීම මත නිශ්චිතව තහවුරු කරගත නොහැකි වූ වාහන 454 කවුරුන් භාරයේ පවතින්නේද යන්න පරීක්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමටත් බාහිර පාර්ශවයන් වෙත විකුණා ඇති බවට සඳහන් වාහන 431 |

| | | | |
|---|---|---|---|
| | මුල්‍ය ප්‍රකාශනවල මුල්‍ය නොවන වත්කම් යටතේ දක්වා ඇති වාහන හා යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව 1202 ක් විය. තවද 2025 නොවැම්බර් 10 දිනැති වාහන සැසඳීම ලේඛනයට අනුව ඉහත වාහන 1962 තුල බාහිර පාර්ශවයන් වෙත විකුණා ඇති වාහන 431ක් හා ලිපිගොනු සොයාගත නොහැකි වීම මත නිශ්චිතව තහවුරු කරගත නොහැකි වූ වාහන 454 ක් ද විය. කෙසේ වුවද 2025 නොවැම්බර් 10 දින වන විට දෙපාර්තමේන්තුව විසින් පරිහරනය කරනු ලබන මුළු වාහන සංඛ්‍යාව 1168 ක් වූ අතර ඉන් වාහන 83 ක් පිටස්තර ආයතන නමින් ලියාපදිංචි වාහන විය . | අපේක්ෂා කරමි. | තහවුරු කර ගැනීමෙන් අනතුරුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියෙන් ඉවත්කර ගැනිමටත් ගිණුම්ගත නොකළ වාහන ගිණුම්ගත කිරිමටත් කටයුතු කළ යුතුය. |
| (iv) | 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඉඩම් හා ජලාශයන්හි තක්සේරු වටිනාකම රු.මිලියන 1,529,182.61 ක් වූ අතර පෙර වර්ෂයේ එම වටිනාකම රු.මිලියන 102,156.84 ක් විය. ඒ අනුව 2024 වර්ෂයේ ජලාශයන් අගය කර ගිණුම්ගත කර තිබුණ ද එම ජලාශයන්හි පිරිවැය අගය කල පදනම මුල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.<br><br>තවද 2022 ජනවාරි 01 දිනට සකස් කර ඉදිරිපත් කර තිබූ වැව් ජලාශ ලේඛනය අනුව දෙපාර්තමේන්තුව සතු වැව්, ජලාශ, අමුණු සංඛ්‍යාව 387ක් වුවද 2024 වර්ෂයේ එම ඉඩම් හා ජලාශ වටිනාකමට අදාළව ලබා දුන් තොරතුරු අනුව එම සංඛ්‍යාව 295 ක් විය.<br><br>තවද වාර්ෂිකව ගිණුම් තැබිමේදී ජලාශ අනුව හදුනාගෙන එම වියදම් ගිණුම්ගත කරනවා | 2023 මැයි10 දින රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, තක්සේරු දෙපාර්තමේන්තුව හා අප දෙපාර්තමේන්තුව අතර පැවති රැස්වීමේ දී ගත් තීරණයක් මත දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් වැව් හා ජලාශ තක්සේරු කර අදාළ තක්සේරු වාර්තාවක් 2023 දෙසැම්බර් 21 ඉදිරිපත් කරන ලදි. අදාළ වාර්තාව පදනම් කර ගෙන වැව් හා ජලාශ වල වටිනාකම් 2024 වර්ෂයේ ජනවාරි මස සිට රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සහිතව සිගාස් පද්ධතියට ගිණුම් ගත කර ඇත.<br><br>මෙහිදී ජලාශ යටතේ පවතින වටිනාකම, අයිතම 17,823 ක් යටතේ පෙන්නුම් කළද ජලාශ නාමයන් (Location) අනුව එම අයිතම බෙදා වෙන් කළ විට එය 295 ක් වැනි අඩු අයිතම ප්‍රමාණයක් යටතේ නිරූපණය වනු ඇත. | වත්කම් අගය කල පදනම මුල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. තවද ජලාශ නාමයන් යටතේ සියලු වියදම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතු අතර එම ජලාශයන් තුළ වූ වත්කම් සංරචකයන් පිළිබද විස්තරාත්මක තොරතුරු ජලාශ නාමය යටතේ වත්කම් ලේඛනයේ පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වෙනුවට එක් එක් වියදම් අයිතමයන් යටතේ ගිණුම් ගත කර තිබුණි. ඒ අනුව මුලා ප්‍රකාශනවල ඉඩම් යටතේ දැක්වෙන ජලාශවල වටිනාකම සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | තවද ඇලදොළ සහ ඇළ මාර්ග/වැව්/බොක්ක සහ මෝය/වැලි සහිත ප්‍රදේශ යන කාණ්ඩ යටතේ අයිතම 175 ක් පෙන්නුම් කරන අතර ඒවා විවිධ කළාප කාර්යාල විසින් විවිධ අවස්ථාවන්වල CIGAS ගිණුම් පද්ධතිය වෙත ඇතුළත්කර ඇත. මීට අමතරව එම කාණ්ඩ යටතේ ඇතුළත් කර ඇති ඇතැම් අයිතම වර්ගීකරණය වෙනස් වී ඇති බව පෙන්නුම් කරන අතර ඒවායේ ජලාශ නාමයන් හා ස්ථාන නිවැරදි කර නැවත එම වටිනාකම් නියමිත ස්ථානයට මාරු කිරිමට කටයුතු කරන බව දන්වා සිටිමි. | |
| (v) | තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරා දී තිබුණද එහි වත්කම්වලට අදාළ වටිනාකම් වාරිමාර්ග අමාත්‍යාංශ වත්කම් යටතේ ගිණුම් ගත වී ඇති බවත් ඒ සඳහා රු.මිලියන 96.96 ක වත්කම් ලැයිස්තුවක් 2024 මැයි මස වාරිමාර්ග දෙපාර්තමේන්තුවට භාරදී තිබුණි. මිට අමතරව වාරිමාර්ග දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ වූ ප්‍රතිපාදන මත රු.මිලියන 8.96 ක් ද වියදම් කර ගිණුම් ගත කර තිබුණි. එහෙත් 2023 දෙසැම්බර් 31 දිනවන විට තල්පිටිගල ජලාශය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් දරන ලද මුළු වියදම රු. මිලියන 646.87 ක් විය. ඒ අනුව ව්‍යාපෘතියට අදාළ වත්කම්වල මුළු වටිනාකම දෙපාර්තමේන්තුව වෙත විධිමත් පරිදි භාරදීමක් හා භාර ගැනීමක් දෙපාර්ශවය විසින් සිදුකර නොතිබුණු බැවින් ව්‍යාපෘතියෙහි තත්‍ය පිරිවැය ගිණුම් තුළින් හෙළිදරව් වීමක් සිදුවී නොතිබුණි. | වාරිමාර්ග අමාත්‍යාංශය විසින් දැරූ සමස්ත වියදම කොපමණක් ද කියා මේ වන තෙක් අප වෙත දැනුම් දීමක් කර නොමැති අතර අමාත්‍යාංශය විසින් අදාළ වියදම වත්කම් වශයෙන් හඳුනාගෙන විධිමත් පරිදි පවරා දීමක් සිදු කරන්නේ නම් ගිණුම් පද්ධතියට වත්කම් වශයෙන් හඳුනා ගත හැකිය. | තල්පිටිගල ජලාශ ව්‍යාපෘතියේ නිවැරදි වටිනාකම දෙපාර්තමේන්තුව යටතේ පමණක් ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vi) | පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරා දී තිබුණ අතර වාරිමාර්ග අමාත්‍යාංශයේ වත්කම් යටතේ ගිණුම්ගත වී ඇති රු. මිලියන 38.40 ක වත්කම් අමාත්‍යාංශයේ සිගාස් පද්ධතියෙන් ඉවත් කර වාරිමාර්ග දෙපාර්තමේන්තුවට භාරදී තිබුණි. ඊට අමතරව 2024 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ වියදම් ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් රු.මිලියන 608.22 ක් වියදම් කර ගිණුම්ගත කර තිබුණි. එහෙත් 2024 වර්ෂයට අදාළ වාරිමාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම්හි ජලාශ යටතේ පහළ මල්වතු ඔය ජලාශය සඳහා රු.මිලියන 495.63 ක වත්කමක් තවදුරටත් ගිණුම්වල දක්වා තිබුණි. | -එම- | පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතියේ නිවැරදි වටිනාකම දෙපාර්තමේන්තුව යටතේ පමණක් ගිණුම් ගත කල යුතුය. |

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | **නිරීක්ෂණ සටහන් පොත**<br><br>වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 07/99 අනුව සියළුම වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවල, ප්‍රධාන නේවාසික ඉංජිනේරු කාර්යාල සහ කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලවල නිරීක්ෂණ සටහන් පොත් තැබිය යුතු වුවත් එම කාර්යාලවල නිරීක්ෂණ සටහන් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මෙම ලේඛන පවත්වාගෙන යන ලෙස සියළුම කලාප වාරිමාර්ග අධ්‍යක්ෂවරුන්ට හා ප්‍රාදේශීය කාර්යාලයන්ට **CFO/FIN/instruction/**2023-2025 හා 2025.05.29 දිනැති ලිපිය මගින් දන්වා ඇත. | අදාල ලේඛන පවත්වාගෙන යන ලෙස ලිඛිත හා වාචිකව ලබාදී ඇති උපදෙස්වලට අනුකූලව කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඉහල කළමනාකරණය විසින් පසුවිපරම් කටයුතු කර තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | **ක්ෂේත්‍ර බඩු සටහන් පොත**<br><br>වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 11/1986 චක්‍රලේඛයේ 5 වන ඡේදයෙහි වාරිමාර්ග 6 ආකෘතිය අනුව ක්ෂේත්‍ර ගබඩාවට ලැබුණු සියළුම ද්‍රව්‍ය ක්ෂේත්‍ර ගබඩාව භාර නිලධාරියා විසින් ක්ෂේත්‍ර තොග පොතට ඇතුළත් කළ යුතු වුවද ඉංජිනේරු සහකාරවරුන් වෙත ක්ෂේත්‍ර වැඩ සඳහා නිකුත් කරනු ලබන ද්‍රව්‍ය පිළිබඳ වාර්තා කිරීමට අදාළ ක්ෂේත්‍ර බඩු සටහන් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණි. | -එම- | -එම- |
| **(iii)** | **කම්කරු ලේඛන**<br><br>1976 අංක 02 දරන වාරිමාර්ග දෙපාර්තමේන්තු චක්‍රලේඛය අනුව දෙපාර්තමේන්තුවට අයත් එක් එක් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල විසින් කම්කරුවන් සේවයේ යොදවා ගැනීමේදී කම්කරු ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. | කම්කරුවන් සඳහා කම්කරු ලේඛන පවත්වා ගනිමින් ගෙවීම් කලයුතු ආකාරය පිළිබඳව සියළුම කළාප වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් දැනුවත් කරමින් 2024 සැප්තැම්බර් 24 දින උපදෙස් ලබා දී ඇත. තවද 2025 වර්ෂයේ සිට නව ආකෘතියක් මගින් කම්කරු ලේඛන පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | -එම- |

**2.** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුනු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ 1.6.1(අ)(i) විගණන නිරීක්ෂණය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1.4.(අ) | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ක්ෂේත්‍ර බඩු සටහන් පොත් පවත්වා ගෙන යා යුතුය. | 1.6.1 (ආ) (i) |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දැදුරු ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් විදුලිබල මණ්ඩලයේ පූර්ණ අයිතිය ඇති උප සමාගමක් සමග 2017 ඔක්තෝබර් 13 දින අවබෝධතා ගිවිසුමකට අත්සන් කර තිබුණු අතර එම අවබෝධතා ගිවිසුමේ 7.1 වගන්තියට අනුව උප සමාගම විසින් මාසිකව උත්පාදනය කරනු ලබන විදුලිය, විදුලිබල මණ්ඩලයට විකිණීමෙන් ලැබෙන ආදායමෙන් සියයට 15 ක් පුරස්කාර ගෙවීම් ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ගෙවීමට එකඟ වී තිබුණි. එහෙත් 2021 ජනවාරි සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ එසේ විදුලිය ජනිත කිරීමෙන් එම උප සමාගම උපයන ලද ආදායමෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයවිය යුතු රු.මිලියන 54.19 න් රු.මිලියන 42.84 ක් හිඟව පැවතිණි. | හිඟ මුදල් 2025 ජුනි 15 දිනට ප්‍රථම ගෙවන ලෙස 2025 මැයි 30 දිනැති වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් උප සමාගම වෙත දැනුම් දී ඇත. | හිඟ මුදල් ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | තවද අවබෝධතා ගිවිසුමට එලඹීමේදී විදුලිය විකිනීමෙන් ලැබෙන ආදායමෙන් සියයට 15 ක් පුරස්කාරය ලෙස තීරණය කළේ කුමන පදනමකින්ද යන්න තහවුරු නොවුණු අතර ගාස්තු ගෙවීමේ ප්‍රමාදයන් සම්බන්ධව කටයුතු කළ යුතු ආකාරය දැක්වෙන කොන්දේසි මෙම අවබෝධතා ගිවිසුමට ඇතුළත්ව නොතිබුණි | දැදුරු ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ විදුලි බලාගාරය පවත්වාගෙන යාම සඳහා අත්සන් කළ අවබෝධතා ගිවිසුම සංශෝධනය කිරීම සඳහා අදාළ අදහස් හා නිරීක්ෂණ ලබාදෙන ලෙස වාරිමාර්ග අධ්‍යක්ෂ (කුරුණෑගල) වෙත දැනුම් දී ඇත. | ප්‍රමාදයකින් තොරව ගාස්තු අයවන ලෙස අවබෝධතා ගිවිසුම කඩිනමින් සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු අතර සියයට 15 පුරස්කාරය සඳහා විධිමත් අනුමැතියක් ලබාගත යුතුය. |

**3.2 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තු සකස් කිරීමේ දී අවශ්‍යතා හඳුනා ගැනීමකින් තොරව මුදල් වෙන්කර ගැනීම හා සැලසුම් කළ පරිදි වැඩ කටයුතු නොකිරීම යන හේතු නිසා සමාලෝචිත වර්ෂයේදී මූලධන වැය විෂයයන් 12 ක රු. මිලියන 7,035 න් රු. මිලියන 5,505.98 ක් එනම් සියයට 78 කට වැඩි ප්‍රමාණයක් 2024 දෙසැම්බර් 31 දිනට ඉතිරිවී තිබුණි. | එක් එක් සංවර්ධන කාර්යයන් සම්බන්ධව පැවැති විවිධ හේතු මත ඉදිකිරීම් කටයුතු පවත්වා ගෙන යාමට නොහැකි වීම මත ප්‍රතිපාදන ඉතුරු වී ඇත. | සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනය මුලුමනින්ම අදාළ වර්ෂයේදී උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මාතලේ දිස්ත්‍රික්කයේ ගොඩිගමුව වැව සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා 2024 වර්ෂයේ අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණද උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද රු.මිලියන 60 ක ප්‍රතිපාදන මාරුකරගෙන තිබුණි. එහෙත් එයින් 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 34.08 ක ප්‍රතිපාදන ඉතිරිව පැවති අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 57 ක් විය. | ඉදිකිරීම් කටයුතු 2024 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සිදුව තිබුණද අයහපත් කාලගුණික තත්ත්වය යටතේ එම කාර්යය ඉටුකිරීමට නොහැකි විය. | මාරු කරන ලද ප්‍රතිපාදන අදාළ වර්ෂයේදීම පූර්ණ ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මහකිතුල පිවිසුම් උමඟ සහ අනුබද්ධ ඇළ මාර්ගය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 1,000 ක් වෙන්කර තිබුණ ද එම සම්පූර්ණ ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර සම්පූර්ණයෙන්ම ඉතිරිකර තිබුණි. ඇස්තමේන්තු සකස් කිරීමේ දී අවශ්‍යතා හඳුනා ගැනීමකින් තොරව මුදල් වෙන්කර ගැනීම, සැලසුම් කළ පරිදි වැඩ කටයුතු නොකිරීම යන හේතු නිසා මෙසේ අයවැය මගින් වෙන් කර තිබූ මුදල් ඌන උපයෝජිතව පැවතුණි. | මෙම උමඟ ඉදිකිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට තාක්ෂණිකමය වශයෙන් අත්දැකීම් නොමැති අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව එවැනි කාර්යයක් භාරගැනීමෙන් තාක්ෂණිකමය වශයෙන් ගැටළු රැසකට මුහුණ දීමට සිදුවිය හැක. මේ සම්බන්ධයෙන් වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි එම උමඟ ඉදිකිරීමේ කාර්යය මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යංශය වෙත ලබාදීමට යෝජනා වී ඇත. | ඉදිකිරීම් හැකියාව හා අවශ්‍යතා හඳුනා ගැනීමකින් පසුව පමණක් ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කළ යුතු අතර එසේ නොමැතිව මුදල් වෙන් කර ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. මුදල් රෙගුලාසි 50 ප්‍රකාර කටයුතු නොකිරීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාරිමාර්ග අමාත්‍යාංශයේ මධ්‍යම වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය සඳහා රු.මිලියන 1,368.73 ක ප්‍රතිපාදන ලබාදී තිබුණද 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 828.87 ක මුදලක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව රු.මිලියන 539.86 ක් අදාළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි. | රුපියල් මිලියන 510 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් 2024 ජූලි මාසයේදී සහ ඉන් පසුව ලැබී ඇත.<br>එම ප්‍රතිපාදන ලැබුණු අයිතමයන් බොහොමයක් ජාතික තරඟකාරී ලංසු තැබීමේ කොන්ත්‍රාත් වූ බැවින් වැඩ සඳහා ගිවිසුම්ගත වී ආරම්භ කරන විට 2024/2025 මහ කන්නය ආරම්භ වී තිබූ බැවින් සැලසුම් කළ ප්‍රගතිය ලබාගත නොහැකි විය.<br>තවද 2024 වර්ෂයේ අග භාගයේ පැවති අධික වර්ෂාව සහ ගංවතුර තත්ත්වය නිසා ද ඉදිකිරීම් කටයුතු සැලසුම් කළ පරිදි සිදුකර ගැනීමට නොහැකි විය. | සැලසුම් කල කාර්යයන් ඉටු නොකිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | අමාත්‍යාංශ දෙපාර්තමේන්තු දිස්ත්‍රික් ලේකම් කාර්යාල වැනි රජයේ වෙනත් ආයතන 20 ක් මගින් විවිධ කාර්යයන් 29 ක් ඉටුකර ගැනීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ මුදල රු.මිලියන 536.62 ක් වුවද 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එයින් වියදම් නොකළ ශේෂය රු.මිලියන 82.70 ක් විය. | එම මුදල් ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.<br>එමෙන්ම ව්‍යාපෘති මගින් පොදු තැන්පත් ගිණුමට ලැබෙන මුදල් වර්ෂය තුළ ලබාදුන් අත්තිකාරම් මුදලක් සේ සලකා එම මූල්‍ය වර්ෂය ඉකුත් වීමට ප්‍රථම වියදම් දරා ඉතිරියක් වෙතොත් වහාම ආපසු පියවා දැමීමට කටයුතු කරන ලෙස කලාප වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | වැඩ සැලැස්මකට අනුව වර්ෂය සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල පමණක් ඉල්ලුම් කිරීමට කටයුතු කළ යුතු අතර ඉතිරියක් වේ නම් එම වර්ෂය තුලදීම ආපසු යවා නිරවුල් කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට වූ ලිඛිත ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශය විසින් මූල්‍ය අවධානම අනුව වැඩි අවදානම් සීමාවේ සිට සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මට අනුකූලව අභ්‍යන්තර විගණනයන් සිදුකර අභ්‍යන්තර පාලන පද්ධතියෙහි පවතින ඌනතාවය නිරීක්ෂණය කර අදාළ කාර්යාල වෙත එම අඩුපාඩු නිවැරදි කරගැනීම හා අභ්‍යන්තර පද්ධතිය ශක්තිමත්ව පවත්වා ගැනීමට නිර්දේශ හා උපදෙස් නිකුත් කර ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | 1983 අංක 23 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 11 වැනි වගන්තිය | වාරිමාර්ග දඩ අරමුදලක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | වාරිමාර්ග දඩ අරමුදල පිහිටුවීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා එනම්, වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සිදු කළ යුත්තක් බැවින් දඩ අරමුදල පිහිටුවීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව සඳහන් කරමි. | 1983 අංක 23 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 11 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය. | | | |
| | XXIV වැනි පරිච්ඡේදයේ 4.1, 4.4 සහ 4.5 | 2025 මැයි 30 දින වන විට මියගිය සේවකයන් 16 දෙනෙකුගෙන් අයවිය යුතු රු.මිලියන 2.05 ක්, විශ්‍රාම ගිය සේවකයන් 51 දෙනෙකුගෙන් අයවිය යුතු රු.මිලියන 4.92 ක් සහ වැඩ තහනමට ලක් වූ, සේවය හැර ගිය හා සේවය අත්හිටවූ සේවකයන් 39 දෙනෙකුගෙන් අය විය යුතු රු. මිලියන 3.78 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ශේෂයන් තුළ වර්ෂ තුනකට වඩා පැරණි රු.මිලියන 4.12 ක ශේෂයක් පැවතුණි. | අයවිය යුතුව පවතින ණය ශේෂ අයකර ගැනිමට කටයුතු කරමින් පවති. | ආයතන සංග්‍රහයෙහි විධිවිධාන ප්‍රකාරව ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර එසේ කටයුතු නොකරන නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මු.රෙ 104 | දෙපාර්තමේන්තුවේ සිදුවී තිබුණු රු.මිලියන 4.39 ක අලාභහානි 15 ක් සඳහා මු.රෙ. 104 පරීක්ෂණ පවත්වා නොතිබුණ අතර අලාභ හානි 02 කට අදාල රු. 245,230 ක් අයකර ගෙන නොතිබුණි. | අලාභ 02 කට අදාලව පවතින රු 245,230 සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව මගින් නෛතික කටයුතු සිදුකරමින් පවතින අතර අලාභ 15 කට අදාලව රු. මී. 4.39 ක් සම්බන්ධයෙන් මු.රෙ. 104 යටතේ පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතී. | මු.රෙ ප්‍රකාරව පරීක්ෂණ පවත්වා අලාභයට වගකිවයුතු පුද්ගලයන්ගෙන් රජයට සිදුවූ අලාභය අයකර ගත යුතුය. නියමිත කාලවකවානු තුළ මු.රෙ. 104 පරීක්ෂණ නොපැවැත් විමට වගකිවයුතු පුද්ගලයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මු.රෙ. 138 | (i)ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල මගින් ඉදිකිරීම් හා නඩත්තු වැඩ සිදුකිරීමේදී කුලී පදනම මත යන්ත්‍ර ලබාගැනීමේ දී එම යන්ත්‍ර වැඩබිමේ යෙදවීම සම්බන්ධවද කම්කරුවන් සපයා ගැනිමේදි සත්‍ය වශයෙන් එම කම්කරුවන් සේවයේ යෙදි ඇති බවටද වැඩබිම වෙත සෘජුව ද්‍රව්‍ය ලැබිමේදි සත්‍ය වශයෙන් භාණ්ඩ වැඩබිම වෙත ලැබි ඇති බවට ද තහවුරු කරගැනිමකින් තොරව ගෙවීම් සිදුකර තිබුණි. | කම්කරුවන් සඳහා කම්කරු ලේඛන පවත්වා ගනිමින් ගෙවීම් කළ යුතු ආකාරය පිළිබඳව සියළුම කළාප වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් දැනුවත් කරමින් 2024.09.24 දින උපදෙස් ලබා දී ඇත. | වවුචරයේ සඳහන් වටිනාකම සෑම ආකාරයෙන්ම තහවුරු කරගැනිමෙන් පසු ගෙවීම් සහතික කළ යුතු අතර එසේ කටයුතු නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. තවද මෙහිදී යම් අක්‍රමිකතා සිදුවීද යන්න සොයා බැලිය යුතුය. |
| | | (ii)මඩකලපුව කළාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය මගින් පාලනය වන රුගම් ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ මුලධන වත්කම් වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීම යටතේ ගෙවීම් කර තිබූ රු.මිලියන 2.61 ක් සඳහා වූ වව්චර් 7 ක ගෙවීම් සහතික කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි බැහැර වීම් වළකා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. | සහතික නොකල වවුචර් සඳහා ගෙවීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා යම් අක්‍රමිකතාවයක් /අලාභයක් සිදු වී නොමැති බවට තහවුරු කළ යුතුය. |
| (iii) | මු.රෙ. 569 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ගංගා ඇලදොල ආශ්‍රිතව කුඩා ජලවිදුලි බලාගාර ඉදිකිරීම, වැලි ඉවත් කිරීම ඇතුලු වෙනත් ආර්ථික කටයුතු සඳහා බලපත්‍ර ලබා දීමට, විවිධ රාජ්‍ය ආයතන වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම වෙනුවෙන් රු.10,000 බැගින් වූ | එක්රැස් කළ ආදායම් හා වියදම් පිළිබඳව නිශ්චිතව හඳුනාගතහැකි පරිදි ගිණුම් තබාගැනීමට හා තැන්පතු ගිණුම් වලින් ඉතිරියක් ඇත්නම් රජයේ ආදායමට බැර කරන ලෙස සියළු අංශ/කලාප ප්‍රධානීන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | එක්රැස් කළ ආදායම් හා වියදම් පිළිබඳව නිශ්චිතව හඳුනාගත හැකි පරිදි ගිණුම් තබා ගැනීමත්,ඒ ඒ කලාප වල එම තැන්පතු ගිණුම්වලින් ඉතිරියක් ඇත්නම් රජයේ අදායමට |

| | | | | |
|---|---|---|---|---|
| | | ගාස්තුවක් අයකර එය තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගනු ලබන තැන්පත් ගිණුමේ රඳවාගෙන වියදම් දරා තිබුණි. මෙම තැන්පත් ගිණුමේ 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. මිලියන 6.29 ක ශේෂයක් පැවති අතර මුදල් රෙගුලාසි ප්‍රකාරව වර්ෂය තුළ එක්රැස් කළ ආදායම් හා දරන ලද වියදම් පිළිබඳ නිශ්චිතව හඳුනාගත හැකි පරිදි ගිණුම් තබා නොතිබුණි. | | බැර කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (iv) | මු.රෙ 571 | 2025 මැයි 26 දිනට වර්ෂ 02 ක කාලයක් ඉක්මවා තිබුණු රු.මිලියන 130.67 ක් වූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එම තැන්පත් ශේෂය තුළ වර්ෂ 5 කට වඩා කල් ඉකුත් වූ රු. මිලියන 6.3 ක තැන්පතු ඇතුළත් වී තිබුණි. | ඉතිරි වූ තැන්පතු ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | වර්ෂ 2 ඉක්මවූ තැන්පතු සම්බන්ධව මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (v) | මු.රෙ 753(1) ,(2) | විවිධ ව්‍යාපෘතින් යටතේ වැව්/ ජලාශ ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා ක්ෂේත්‍රයට සෘජුවම ලැබෙන ද්‍රව්‍ය සඳහා භාණ්ඩ නිකුත් කිරීමේ ඇණවුම් හා භාණ්ඩ ලැබීම් ඇනවුම් පිළියෙල කර නොතිබුණි. | ක්ෂේත්‍රයට සෘජුවම ලැබෙන ද්‍රව්‍ය සම්බන්ධයෙන් උපදෙස් මාලාවක් නිකුත් කර ඇත. | උපදෙස් වලට අනුකූලව කටයුතු කරන්නේද යන්න පිළිබඳව කළමනාකරණය විසින් පසුවිපරම් කර තහවුරු කර ගැනීම කළ යුතුය. |
| (vi) | මු.රෙ 756 | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවල මෙහෙයුම් හා නඩත්තු වැඩ සහ ඉදිකිරීම් කර්මාන්ත සඳහා වූ ද්‍රව්‍ය නිකුත් කිරීමෙන් පසු ඉංජිනේරු සහකාරවරුන් භාරයේ | දෙපාර්තමේන්තුවට අයත් වැඩබිම්වල ඉංජිනේරු සහකාරවරුන් භාරයේ ඇති ද්‍රව්‍ය ශේෂයෙන් භෞතිකව සත්‍යාපනය කිරීම වාර්ෂික ගබඩා සමීක්ෂණ මණ්ඩල මගින් සිදුකරන ලෙස අංක - | මු.රෙ 756 විධිවිධාන ප්‍රකාරව ඉංජිනේරු සහකාරවරුන් භාරයේ ඇති ද්‍රව්‍ය වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ |

| | | | | |
|---|---|---|---|---|
| | | ඇති ද්‍රව්‍ය වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මගින් භෞතිකව පරීක්ෂා කර නොතිබුණි. | FIN/ST/VR/2024 හා 2024 නොවැම්බර් 27 දිනැති ලිපිය මගින් දන්වා ඇත. | මණ්ඩලය මගින් පරීක්ෂාවට ලක් කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | වාරිමාර්ග දෙපාර්තමේන්තු චක්‍රලේඛ | | | |
| (i) | 1982 අංක 23 දරන වාරිමාර්ග දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ (අ) ඡේදය | ඉංජිනේරු සහකාරවරුන් විසින් ඊලඟ මාසයේ වැඩකරන දින 5 ක් ඇතුළත මාසික ද්‍රව්‍ය වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මාසික ද්‍රව්‍ය වාර්තා ඉදිරිපත් කරන ලෙස සියළුම අංශ ප්‍රධානීන් දැනුවත් කරමින් උපදෙස් ලිපි නිකුත් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු අතර එම උපදෙස් වලට අනුකූලව කටයුතු කරන්නේද යන්න පිලිබඳව කළමනාකරණය විසින් පරීක්ෂාවකට ලක් කර තහවුරු කරගැනීම කළ යුතුය. |
| (ii) | 2023 පෙබරවාරි 28 දිනැති අංක 03/2023 දරන වාරිමාර්ග චක්‍රලේඛය | ක්ෂේත්‍ර නිලධාරින් තම රාජකාරි කටයුතු කිරීම සඳහා විධිමත් මාසික ඉදිරි වැඩසටහන් පූර්ව මාසයේ 25 වැනි දිනට හෝ එදිනට පෙර තම ආසන්න ප්‍රධානියා වෙත ඉදිරිපත්කර අනුමැතිය ලබාගත යුතු වුවත් දෙපාර්තමේන්තුවට අනුයුක්ත ඉංජිනේරු සහකාරවරුන් හා තාක්ෂණික සහයකයින් විසින් ක්ෂේත්‍ර රාජකාරි වලට අදාළ එම වැඩසටහන් ඉදිරිපත් කර නොතිබුණි. ඒ පිළිබඳ නොසලකා එම නිලධාරීන්ට ක්ෂේත්‍ර රාජකාරී කිරීමට අවසර දී තිබුණි. | මේ පිළිබඳව වරින් වර චක්‍රලේඛ මගින් කලාප වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් හා ක්ෂේත්‍ර නිලධාරින් දැනුවත් කර ඇති අතර ඉදිරියේදී තවදුරටත් සොයා බලා අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් ලබාදුනිමි. | චක්‍රලේඛ ප්‍රකාර ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ඉදිරි වැඩසටහන් අනුමත කිරීමෙන් පමණක් ක්ෂේත්‍ර රාජකාරි සඳහා අවසර දිය යුතුය. |

3.6 **තැන්පතු**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගනු ලබන තැන්පතු ගිණුමේ 2024 දෙසැම්බර් 31 දිනට පැවති ඇතැම් තැන්පතු අදාළ කාර්යය සඳහා යොදවා නොගෙන 2021 වර්ෂයේ සිට රඳවාගෙන තිබුණි. එසේ රඳවාගන්නා ලද තැන්පතු අතර 2024 දෙසැම්බර් 31 දිනට රු. 300,000 වඩා වැඩි වටිනාකම් සහිත තැන්පතු 69 ක් තුළ රු.මිලියන 208.2 ක ශේෂයක් පැවතුණි. | තැන්පතු ශේෂයන් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවති. | තැන්පතු ශේෂයන් කඩිනමින් නිරවුල් කළ යුතුය. |
| (ආ) | උක්ත තැන්පතු ගිණුමේ තෙවන පාර්ශවයන්ට අදාළ තැන්පතු පමණක් සඳහන් විය යුතු වුවත් තෙවන පාර්ශවයන් නොවන වාරිමාර්ග නිලධාරීන්ගේ හා ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්ගේ නමින් සිදුකල තැන්පතු 43 කට අදාළව රු.මි. 53.84 ක ශේෂයක් 2024 දෙසැම්බර් 31 දිනට පැවතුණි. එහෙත් වාරිමාර්ග අමාත්‍යාංශය හා වාරිමාර්ග දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ මෙම මුදල් මේ වනවිට ප්‍රතිපාදනයන්ට එරෙහිව වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කළ අරමුදල් මෙසේ වියදම් වූ ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කර එයට සමාන මුදලක් තැන්පතු ගිණුම්වල නිශ්කාර්යව පැවතුණි. | එම රදවා ගෙන ඇති මුදල් සඳහා අදාළ වැඩ කොටස් කඩිනමින් ඉටුනොකරන්නේ නම් අදාළ පාර්ශවයන් වෙත එම මුදල නැවත ලබාදීමට කටයුතු කිරීම හෝ තවදුරටත් රදවා තබා ගැනීමට හේතු දන්වන ලෙස අදාළ කලාප කාර්යාල දැනුවත් කර ඇත. | තැන්පතු යටතේ වන කාර්යයන් කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතු අතර තෙවන පාර්ශවයන් නොවන නිලධාරීන්ගේ නමින් තැන්පතු ගිණුමේ මුදල් තැන්පත් නොකළ යුතුය. |
| (ඇ) | දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකළ චීන සමාගම විසින් ව්‍යාපෘති කාර්යයන් කිහිපයක් වෙනුවෙන් රු.මිලියන 21.36 ක් ගාල්ල කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයට ලබාදී තිබුණි. මාතර නිල්වලා වේලි ව්‍යාපෘතියේ BR-5 | මෙම පිටවාන ඉදි කිරීම නිසාවෙන් පිටවාන සහ නිල්වලා ගඟ අතර වෙසෙන ජනතාව විසින් මෙම ඉදි කිරීම් කටයුතු වලට දැඩි විරෝධතාවක් දැක්වීම හේතුවෙන් දිගින් දිගටම | මෙම කාර්යයන් කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බැම්ම 2003 වර්ෂයේ හානි වී තිබීම හේතුවෙන් මාතර කිරලකැලේ ප්‍රදේශයට ඇතිවී තිබූ ගංවතුර අවධානම පාලනය කිරීමේ අරමුණින් එම මුදල් තැන්පත් ගිණුමේ දක්වා තිබුණි. 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම මුදලින් රු.මිලියන 1.12 ක් පමණක් වැයකර තිබීමෙන් රු. මිලියන 20.24 ක ශේෂයක් පැවතුණි. | එම කටයුත්ත ප්‍රමාද වී ඇත. නිල්වලා යෝජනා ක්‍රමය යටතේ ඉදි කරන ලද මෙම පිටවාන සැලසුම් කර ඇති උසට නැවත කොන්ක්‍රීට් කර ඉදි කිරීමට මේ වන විට ඇස්තමේන්තුවක් සකස් කර ඇත. | |

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 සැලැසුම් කිරීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය අනුව ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි කළාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල 14 කට බෙදා ඒ යටතේ වූ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 52 ක් මගින් වැව් ජලාශවල මෙහෙයුම් හා නඩත්තු වැඩ සිදුකර තිබුණි.එම කාර්යයන්හි අධීක්ෂණයන් ඍජුව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ට පැවරෙන පරිදි සංවිධාන ව්‍යුහය සැකසී ඇති අතර 2024 වර්ෂයට ඉදිරිපත්කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ මෙම ඒක් එක් කාර්යාලවලින් සිදුකිරීමට සැලසුම්කර තිබූ කාර්යයන් සඳහන් කර නොතිබුණි. | එක් එක් කාර්යාල මගින් සිදුකිරීමට සැලසුම් කර තිබූ කාර්යයන් කලාප කාර්යාල 14 හා ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 52 ලෙස කාර්යාල 66 ක් වශයෙන් ඇතුළත් කළ යුතු බවට මෙතෙක් උපදෙස් ලැබී නොමැත. | එක් එක් කාර්යාලවලින් සිදුකිරීමට සැලසුම්කර තිබූ කාර්යයන් සඳහන් කරමින් ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය අනුව ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාල 3 ක් යටතේ වූ යාන්ත්‍රික වැඩපොල 14 කට බෙදා තිබුණි. 2024 වර්ෂයට ඉදිරිපත්කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි එම එක් එක් කාර්යාල වලින් සිදුකිරීමට සැලසුම්කර තිබූ කාර්යයන් සඳහන්කර නොතිබුණි. | විශේෂයෙන්ම එදිනෙදා සිදුකළ යුතු වාහන අලුත්වැඩියාවන්, ගේට්ටුවල අලුත්වැඩියාවන් ආදී කටයුතු ප්‍රධානව සිදුකරනු ලබන අතර එම කාර්යයන් ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කළ යුතු ආකාරය පැහැදිලි නැත. | -එම- |

**4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය** | | |
| (i) | ව්‍යාපෘතියේ අනුමත ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 17,914.20 න් කාර්යසාධන වාර්තාවට අනුව 2024 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 17,689.01 ක මුදලක් වැය කර සියයට 97.44 ක භෞතික ප්‍රගතියක් ලගා කර ගෙන ඇති බවට සඳහන් කර තිබුණි. ඒසේ වුවද 2024 දෙසැම්බර් 23 දින ඉදිකිරිමට අපේක්ෂිත නව වැඩ කාර්යයන්ද ඇතුළත්ව ඉතිරි වැඩ රු.මිලියන 22,017ක් දක්වා ඇස්තමේන්තු වටිනාකම සංශෝධනය කිරිමට හා කාලය 2026 දෙසැම්බර් 31 දක්වා දීර්ඝකර ගැනීමට 2025 මැයි 26 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය ආරම්භකර වසර 12 කට වඩා අධික කාලයක් ගතවී තිබුණද අපේක්ෂිත ප්‍රතිලාභ පූර්ණ ලෙස ලබා ගැනිමට තවදුරටත් ප්‍රමාද වී තිබුණි. | මෙම ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු 2024.12.31 වන දින විට නිම කිරීමට නියමිතව තිබුණි. නමුත් අළුතින් නිම කළ යුතු කාර්යයන් බොහෝමයක් ඉදි කිරීම් කටයුතු කර ගෙන යාමේදී හදුනාගෙන තිබීම හා මෙම අනුමත ඇස්තමේන්තුව 2021 වර්ෂයේ පැවති මිල ගණන් යටතේ පිළියෙල කරන ලද්දක් වූ හෙයින් පවතින මිල ගණන් යටතේ අදාළ කාර්යයන් කිරීමේ ගැටළුවකට මුහුණ දී තිබුණි. නමුත් මේ වන විට මෙම ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීමට හා සංශෝධිත ඇස්තමේන්තුව සදහා කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර ඒ අනුව ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කර ඇත. | ව්‍යාපෘතිය තවදුරටත් ප්‍රමාද නොකර කඩිනමින් නිම කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කළ යුතු අතර අයවැයෙන් ලැබෙන ප්‍රතිපාදනය ඒ වර්ෂය තුළදීම වැය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. එසේ නොකරන අවස්ථාවලදී ඊට වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | පහළනිම්න සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සැලසුම් කල නිර්මිතයන් 2025 ජුනි මස වන තෙක් පූර්ණලෙස නිම නොවිම නිසා ව්‍යාපෘතිය ආරම්භයට පෙර මෙම ප්‍රදේශයන්හි යල හා මහ දෙකන්නයේ වගා තිව්රතාව වූ අක්කර 18232 ව්‍යාපෘතිය නිමවීමෙන් පසු අක්කර 48132 දක්වා යල,මහ හා අතරමැදි කන්න වශයෙන් වැඩිකර ගැනීමට සැලසුම් කර තිබුණද, දැනට වගාකරන මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 26,369 ක් පමණක් විය. | ප්‍රායෝගිකව ඇලක ඉතා සුළු කොටසක ඉදි කිරීම් අවසන් නොකළේ නම් මුළු ඇල යටතේම ලැබෙන ප්‍රතිලාභ නොලැබීම මෙයට හේතු විය. | සැලසුමකට අනුව අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | කුඩා ඔය සිංහලයාගම ඇල කිලෝමීටර් 36 ක් ඉදිකිරීමට සැලසුම්කර තිබූ අතර 2024 නොවැම්බර් 28 වන විට ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 1037.21 ක් වූ වැඩ අයිතම 91 ක කොටස් තවදුරටත් නිමකළ යුතුව තිබුණි. ඉන් ඇස්තමේන්තු ගත පිරිවැය රු. මිලියන 563.82 ක් වූ වැඩ අයිතම 61 ක කිසිදු ඉදිකිරීමක් මේ දක්වා කර නොතිබුණි. | සංශෝධිත නව ඇස්තමේන්තුවට අනුව මෙම ඇල ඉදිකිරීම සඳහා අවශ්‍ය වන මුළු මුදල රු.මිලියන 3,171.33 කි. ඉතිරිවී ඇති වැඩ කොටස් සියල්ල මෙම නව සංශෝධිත ඇස්තමේන්තුව ඇතුළත ඉටු කිරීමට අපේක්ෂා කෙරේ. | කඩිනමින් වැඩ නිම කර අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර දීමට කටයුතු කළ යුතුය. |
| (iv) | හඳපානාගල ජලාශයේ ධාරිතාවය වැඩි කර වම් ඉවුරු ඇල මාර්ගයෙහි ජල හැරවුම් ස්ථාන 15 ක් හා ස්ථාන 9 ක බෙදුම් ඇලවල් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. එහෙත් වම් ඉවුරු ඇලේ පළමු බෙදුම් ඇල මාර්ග තුන හා කෙත් ඇල මාර්ග කිසිවක් ඉදිකර නොතිබුණි. | සැලසුම් කළ කාර්යයන් විවිධ අවස්ථාවන් හිදි වෙනස් වීමකට ලක් වේ. ඒ සඳහා විවිධ හේතු බලපායි. ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළු හා එම ප්‍රදේශයන්හි පවතින ස්ථාවර වගාවන් ඉවත් කිරීම අපහසු වීම මෙම ඉදි කිරීම් නවතා දැමීමට හේතු වී ඇත. | ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන ලබාගැනීමට පෙර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා බලපාන ගැටළු නිරාකරණය කර ගැනීම නිලධාරීන්ගේ වගකීම විය යුතුය. එසේ වගකීම පැහැර හරින ලද නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (v) | ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 1.74 ක් යටතේ කිලෝමීටර් 6+950 ස්ථානයේ DC05 බෙදුම් ඇල ඉදිකිරීම සඳහා රුපියල් 773,589 ක් වැයකර තිබුණි. ඊට සම්බන්ධ FC1 හා FC2 ලෙස කෙත් ඇල මාර්ග 2 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබූ නමුත් එම ඇලමාර්ග ඉදිකර නොතිබීම හේතුවෙන් ඒ ආශ්‍රිත වගා ඉඩම් වලට ජලය ලබා දිමට නොහැකි වි තිබුණි. | මෙවැනි කාර්යයන් සඳහා තවදුරටත් ප්‍රතිපාදන යොදවා ගෙන කරගෙන ගියේ නම් මේ වන විට කර ඇති සමහර ප්‍රධාන ඉදි කිරීම් කිරීමට ද ප්‍රතිපාදන බාධාවක් විය හැක. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ඇල මාර්ගයේ වැඩ නිම කළ යුතුය. |
| (vi) | ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 3.13 ක් යටතේ කිලෝමීටර් 7+500 ස්ථානයේ DC06 බෙදුම් ඇල ඉදිකිරීම සඳහා රු.මි. 2.17 ක් වැයකර තිබුණි. එම බෙදුම් ඇලට FC1 සිට FC6 දක්වා කෙත් ඇල මාර්ග 6 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබූ නමුත් එම ඇල මාර්ග ඉදිකර නොතිබුණි. | ඉදිකිරීම් කටයුතු සඳහා ඇස්තමේන්තු සැකසුව ද ප්‍රතිපාදන වෙන් කිරීමේදී එක් එක් කර්මාන්තය සඳහා අවශ්‍ය වන මුළු ප්‍රතිපාදන ප්‍රමාණයම ලබා නොදෙන අවස්ථා ඇත. මෙහිදි පෙනී යන්නේ වෙන් කර දී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය අනුව කටයුතු කර ඇති බවකි. | -එම- |

| | | | |
|---|---|---|---|
| (vii) | විදුලිබල මණ්ඩලයට අයත් ට්‍රාන්ස්ෆොමරයක් සහ විදුලි රැහැන් සහිත කණුවක් පැවතිම මත DC06 බෙදුම් ඇලෙහි මීටර් 30 ක පමණ කොටසක ඉදිකිරීම් නවතා දමා තිබුණි. මෙහිදි මෙම විදුලි ට්‍රාන්ස්ෆොමරය සහිත විදුලි කණුව ගැන පූර්ව අධ්‍යානයකින් තොරව දෙපසින් ඇල මාර්ගය කැපීම මේ සඳහා මූලික වී තිබුණි. ඒ අනුව DC06 ඇළ මාර්ගයෙහි ඉදිකිරීම් නිම නොවීම තුළ ඇලෙහි පහල කොටසේ මීටර් 1,700 ක පමණ කොටසකට මේ වන විට වාරි ජලය සැපයීමට නොහැකිවී තිබුණි. | වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයන් සීමා සහිතය. බලාපොරොත්තු වන සියළු වැඩ කටයුතු මෙම ව්‍යාපෘතිය යටතේ ඉටු කළ නොහැක. ව්‍යාපෘතියේ ප්‍රතිපාදන ඉදිරියේදී ඉතිරි වන්නේ නම් පමණක් අමතර වැඩ කොටස් කෙරෙහි අවධානය යොමු කළ හැක. | කඩිනමින් වැඩ නිම කර අපේක්ෂිත ප්‍රතිලාභ අත්කරදීමට කටයුතු කළ යුතුය. |
| (viii) | ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 3.55 යටතේ කිලෝමීටර් 4+500 ස්ථානයේ R2 රෙගියුලේටර් ගේට්ටුවක් රු.මිලියන 3.29 ක් වැයකර ඉදිකර තිබුණි. පතුලේ සිට ගේට්ටුව උපරිම උසට එසවීමෙන් පසුවද වම් ඉවුරු ඇලෙහි ජලය රෙගියුලෙටර් ගේට්ටු වලට දෙපසින් පිහිටි කොන්ක්‍රීට් බැම්වලටද ඉහලින් ගමන් කරමින් පැවතුණි. ඒ අනුව වම් ඉවුරු ඇළේ ජල බැස්ම පාලනය කළ හැකිවන පරිදි මෙම ඉදිකිරිම සිදුකර නොතිබුණි. | රෙගියුලේටර් ගේට්ටුව දෙපස ඇති බැම් දෙක ඉදි කර ඇත්තේ වැඩි වතුර පැමිණියහොත් ඒ හරහා ගමන් කිරීමටයි. මෙය ගේට්ටුව ඇර තිබුණද වසා තිබුණද ජලය එම බැම් උඩින් ගලා යා හැක. එසේ වීමට විවිධ හේතු තිබිය හැක. | වම් ඉවුරු ඇලේ ජල බැස්ම පාලනය කළහැකි වන පරිදි රෙගියුලේටර් ගේට්ටුව ඉදිකිරීම සිදුවී නොමැතිද යන්න පිළිබදව පරීක්ෂණයක් පවත්වා වාර්තා කළ යුතුය. |
| (ix) | අලි කොටආර හා හඳපානාගල ජලාශ ඉදිකිරීමේදී හා ඇල මාර්ග තැනිමේදී වැල්ලවාය ප්‍රදේශයේ අත්පත් කරගත් ඉඩම් කට්ටි 698 න් වන්දි මුදල් ගෙවා අවසන් කල ඉඩම් කට්ටි සංඛ්‍යාව 579 ක් වූ අතර ඒ සඳහා ගෙවා ඇති වන්දි මුදලෙහි වටිනාකම රු.මි. 491.64 ක් විය. එහෙත් වන්දි මුදල් නොගෙවූ ඉඩම් කට්ටි 119 න් 70 ක් සඳහා තක්සේරුවවත් ලබා ගැනීමට මේ දක්වා ක්‍රියාකර නොතිබුණි. | ඉඩම් පවරා ගැනීම බෙදාදීම වන්දි ගෙවීමේ කාර්යයන්හි බලය පැවරී ඇත්තේ අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙතය. විගණනය විසින් සඳහන් කරන කරුණ යෝග්‍ය කරුණක් වුවද ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුත්තේ නිසි බලධරයන්ය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමග සම්බන්ධීකරණයක් පවත්වා වන්දි ගෙවීම් කටයුතු කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතු අතර තක්සේරුව ලබානොගත් ඉඩම් සඳහා කඩිනමින් තක්සේරුව ලබා ගත යුතුය. |
| (x) | හඳපානාගල වම් ඉවුර ඇල මාර්ගය යටතේ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවුල් 110 සඳහා වාරි ඉඩම් ලබාදීම | ඉඩම් අත්පත් කරගැනීමේ කාර්යය උමා ඔය බහු කාර්යය ව්‍යාපෘතිය යටතේ සිදුකර ඇත.උමා ඔය පහළ | ප්‍රාදේශීය ලේකම්ගේ ඍජු මැදිහත් වීම මත මෙම අනවසර ඉඩම් ගැටලුව නිරාකරණයට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් පවතින ගැටළු හඳුනාගැනීම සඳහා වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2024 මාර්තු 19, 22, 23 සහ 24 දිනයන් හි වාරි ඉඩම්ලාභීන් 110 දෙනාගෙන් 51 ක් සම්බන්ධව සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදි ඉන් 9 දෙනෙකුගේ පමණක් වගාබිම් නිරවුල්ව පැවතිණි. අනෙකුත් බිම් කට්ටිවල අනවසර පදිංචි කරුවන් අත්පත් කරගැනීම හේතුවෙන් එම ඉඩම් වලට ප්‍රවේශ වීමට නොහැකිවී තිබුණි. | නිම්න සංවර්ධන ව්‍යාපෘති යටතේ පවරා ගත් ඉඩම් කට්ටි වලට අදාල සියළු තොරතුරු ව්‍යාපෘති කාර්යාලය සතුව ඇත. | |
| (xi) | ව්‍යාපෘති කාර්යාලයක් වෙනම පවත්වාගෙන ගොස් තිබුණද, ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, වන්දි ගෙවීම හා නව කුඹුරු ඉඩම් බෙදාදීම යන සියලු කටයුතු ප්‍රමාදකින් තොරව නිමකිරීම හා පහසුවනු පිණිස යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන පරිඝනක පද්ධතියක් නොතිබුණි. | ඉඩම් අත්පත් කරගැනීමේ කාර්යය උමා ඔය බහු කාර්යය ව්‍යාපෘතිය යටතේ සිදු කර ඇත. උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘති යටතේ පවරා ගත් ඉඩම් කට්ටි වලට අදාල සියළු තොරතුරු නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය සතුව ඇත. | තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා පරිගණක පද්ධතියක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **පහළ මල්වතු ඔය සංවර්ධන ව්‍යාපෘතිය** | | |
| (i) | උක්ත ව්‍යාපෘතිය රු. මිලියන 22,900 ක ඇස්තමේන්තුගත මුදලක් යටතේ 2016 වසරේ ආරම්භ කර වසර 08ක් තුළ එනම් 2024 නිම කිරීමට සැලසුම් කර තිබුණි. 2025 දෙසැම්බර් 31 දක්වා කාල දිගුවක් ඉල්ලා තිබුණි. අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට සමස්ථ මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 1,817.44 ක් හා භෞතික ප්‍රගතිය සියයට 7.03 ක් විය. ඒ අනුව ඉතිරි සියයට 92.97 ප්‍රගතිය 2025 දෙසැම්බර් 31 දිනට ලගා කරගත හැකිද යන්න විගණනයට ගැටළු සහගත විය. ව්‍යාපෘතිය නියමිත කාලය තුළ නිමකිරීමට නොහැකි විම තුලින් අපේක්ෂිත ප්‍රතිලාභ ජාතික ආර්ථිකයට අහිමි වි තිබුණි. | මෙම ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු තීරණය අනුව තාවකාලිකව නවතා ඇත. මේ වන විට මෙම ව්‍යාපෘතියට අදාළ මූලික ඇස්තමේන්තුව සංශෝධනය කර ඇති අතර ව්‍යාපෘතියේ කාලය 2029 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර ගැනීමට අදාල කැබිනට් සංදේශයේ කෙටුම්පතක් වාරිමාර්ග අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. මේ දක්වා එයට අනුමැතිය ද ලැබී නොමැත. | ව්‍යාපෘතිය අතරමග නතර කිරීමකින් තොරව කරගෙන යාම සඳහා මූල්‍යමය ශක්‍යතාව සැලකිල්ලට ගැනීමෙන් පසුව පමණක් ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කළ යුතු අතර අයවැයෙන් ලැබෙන ප්‍රතිපාදන ඒ වර්ෂය තුළදීම වැයකිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. එසේ කටයුතු නොකරන නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. එකම ව්‍යාපෘතිය සඳහා දිගින් දිගටම ප්‍රතිපාදන වෙන් කර ගැනීම හේතුවෙන් නව ව්‍යාපෘති හඳුන්වාදීමට ඇති ඉඩකඩ ඇහිරී යාම සම්බන්ධයෙන්ද අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | උක්ත ව්‍යාපෘතිය යටතේ වූ ජලාශයේ පිටවාන ඉදිකිරීමට රු.මිලියන 4,573 ක් ඇස්තමේන්තු කර තිබූ නමුත් මේ දක්වා ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. පිටවානෙහි ඉදිකිරීම් ප්‍රමාද වීම නිසා වැව් බැම්මේ මීටර් 0+250 සිට 1+200 දක්වා කොටසේ ඉදිකිරීම් කටයුතු නතර වී තිබුණි. | මෙම කරුණු නිවැරදිය. සංශෝධිත නව ඇස්තමේන්තුවට අනුව සිවිල් වැඩ සඳහා රු. මිලියන 6,551ක මුදලක් අවශ්‍ය වේ. එම මුදල අනෙකුත් වියදම් ද සහිතව රු. මිලියන 11,044කි. මීට අදාළව ප්‍රතිපාදන ලබා ගැනීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයෙන් විමසීම් කළද මේ දක්වා පිළිතුරක් ලැබී නොමැත. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීම සඳහා තවදුරටත් ප්‍රමාද නොකර වැඩ නිමකිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iii) | ව්‍යාපෘතිය නිමකිරීම සඳහා 2025 දෙසැම්බර් 31 දක්වා ඉල්ලීම් කළද 2025 වර්ෂයට විස්තරාත්මක වැඩ සැලැස්මක් සකස් කර නොතිබීමෙන් 2025 වර්ෂය තුල වෙන්කල රු. මිලියන 5,000 ක මුදල පූර්ණ ලෙස උපයෝජනය කර ව්‍යාපෘතිය නිම කිරීමේ හැකියාව විගණනයට තහවුරු නොවුණි. | වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කළද එම ප්‍රතිපාදන වියදම් කිරීම සඳහා අදාළ අනුමැතීන් ලබා ගත යුතුය. වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් භාගයක් පමණ පිටවානේ ඉදි කිරීම් වෙනුවෙන් යොදවා ගැනීමට සැලසුම් කර ඇත. පිට වානේ ඉදි කිරීම් ආරම්භ කළේ නම් අනෙකුත් ඉදි කිරීම් ද ඊට සමගාමීව කරගෙන යෑමේ හැකියාව පවතී. එසේම ඉඩම් අතපත් කර ගැනීමේ කාර්යය හා නැවත පදිංචි කිරීමේ කාර්යයන්ද ඊට සමගාමීව කරගෙන යා යුතුය. මෙවැනි කාර්යයන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සෘජුවම කළ නොහැක. එසේම රජය මේ සම්බන්ධයෙන් දෙනු ලබන උපදෙස් වලටද අනුකූලව කටයුතු කළ යුතුය. එබැවින් රු. මිලියන 5,000 මේ වසර සඳහා උපයෝගී කර ගැනීම මේ අනුව කළ නොහැක. | නිසි සැලසුමකින් තොරව ප්‍රතිපාදන ලබාගැනීම සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් වගකිව යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | **ඊරු වැව -මහකනදරාව පෝෂිත ඇල ව්‍යාපෘතිය** | | |
| | මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 2,000 ඇස්තමේන්තුවක් යටතේ ප්‍රතිපාදන භාවිතා කර 2024 -2026 කාලය තුල අනුරාධපුර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් නිම කිරිමට සැලසුම් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2024 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 1000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් රු. මිලියන 375.78 පමණක් වැය කර තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 12.2ක් විය. | මෙම ඇස්තමේන්තුවේ ඊරු වැව මහකනදරාව පෝෂිත ඇලට සම්බන්ධ නොවන මහකනදරාව, ඊරු වැව ආදීන් හි වැඩිදියුණු කිරීම් ද අයත්ය. මූලික අරමුණ වන්නේ ඊරු වැව මහකනදරාව පෝෂිත ඇල ඉදිකිරීම් කටයුතු නිම කර මූලික අරමුණ ඉටු කර ගැනීමය. එම කාර්යය මේ වන විට බොහෝ දුරට නිම කර ඇත. ඇස්තමේන්තුවට අදාළ අනෙකුත් ඉදිකිරීම් කටයුතු කඩිනමින් කර ගෙන යැමට අවශ්‍ය පියවර ගෙන ඇත. | ව්‍යාපෘති කාර්යයන් සැලසුම් කල පරිදි 2026 වර්ෂයේදී නිම කිරිමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | **වාරි සෞභාග්‍යා ජාතික ව්‍යාපාරය** | | |
| | ගම්පහ දිස්ත්‍රික් ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය වාරි සෞභාග්‍යා ජාතික ව්‍යාපෘති යටතේ 2021 වර්ෂයේ දී ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 37.21 ක් වූ ව්‍යාපෘති 03 ක් සඳහා රු.මිලියන 16.06 ක් වියදම් කර තිබූ නමුත්, මෙම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය 2025 අප්‍රේල් 04 වන විට වර්ෂ 04 ක පමණ කාලයක් ගතවී තිබියදීත් සියයට 45 සිට සියයට 60 දක්වා අවම මට්ටමක පැවතිණි. | පනුගල අමුණ වැඩිදියුණු කිරීමේ කාර්යයට අදාළ ඉදිරි වැඩ නිමකිරීමට අදාළ උපදෙස් ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු - ගම්පහ වෙත ලබා දී ඇති අතර පුංචි මා එළිය අමුණ හි ඉටුනොකරන ලද කාර්යයන්ට අදාළ නව සැලසුම් මේ වන විට සැලසුම් අංශය මගින් සකස් කරමින් පවතී. එය ලැබුණු පසු ඇස්තමේන්තුගත කර ඉටුකිරීමට කටයුතු යොදා ඇති බවත්, පුවක්ගස් දෙනියාය ජලාශය ඉදිකිරීම ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන්නක් නිසා ඒ සඳහා විශේෂ අනුමැතියකින් තොරව වාරිමාර්ග | ඉදිකිරීම් කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතු අතර දෙනියාය ජලාශය සඳහා අවශ්‍ය අවසරයන් තවදුරටත් ප්‍රමාද නොකර ලබාගත යුතුය.<br>තවද අවශ්‍ය අවසරයන් ලබාගැනීමකින් තොරව ප්‍රතිපාදන ලබාගැනීමට මින් ඉදිරියට කටයුතු නොකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | | දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යොදාගත නොහැක. |

## 4.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය** | | |
| (i) | මෙම ව්‍යාපෘතිය රු. මිලියන 48,355.3 ඇස්තමේන්තු වටිනාකමක් යටතේ 2012 වර්ෂයේ ආරම්භකර 2021 වර්ෂයේ අවසන් කිරීමට මුලිකව සැලසුම් කර තිබූණ ද එම කාලය 2024 දෙසැම්බර් 31 දක්වා දීර්ඝකර තිබුණ අතර එදිනට රු. මිලියන 41,953 ක් වැය කර තිබුණි. හොරොව්පොතාන හා ගොමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් ගොඩ සහ මඩ නව ඉඩම් හෙක්ටයාර් 1515 කට වාරි පහසුකම් සපයා වගාවන්ට එක් කිරිමේ මුලික අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණද , වනසංරක්ෂන දෙපාර්තමේන්තුව නිදහස් කිරීමට එකගවී තිබුණු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 865.45 ක් විය. මෙම ඉඩම් ප්‍රමාණයෙන් 2025 මාර්තු 25 දින වන විට නව කුඹුරු ඉඩම් හෙක්ටයාර් 773.62 ක් පමණක් වගාකිරිම සඳහා සඳහා වාරි පහසුකම් සපයා තිබුණු අතර හෙක්ටයාර 741.38 ක් වගා කිරිම සඳහා ගොවින් වෙත ලබාදි නොතිබුණි. තවද ව්‍යාපෘතිය නිසා කුඹුරු ඉඩම් අහිමි වුවන් වෙනුවෙන් උපරිමය අක්කර 1.5 බැගින් ලබාදිමට සැලසුම් කර තිබු නමුත් ඒ සඳහා අවශ්‍ය කුඹුරු ඉඩම් හදුනා ගෙන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නිදහස් කර ගෙන නොතිබීම හේතුවෙන් කුඹුරු ඉඩම් ලබා දිමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් කුඹුරු ඉඩම් වෙනුවට පවුල් ඒකක 540 සඳහා උපරිමය රු. මිලියන 1.8 බැගින් රු.මිලියන | යාන් ඔය ජලාශය යටතේ විකල්ප ඉඩම් ලබා දීම සඳහා යෝජිත ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 1515 ක් වුවද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් නිදහස් කර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 865.45 ක් වේ. එනම් අනුරාධපුර දිස්ත්‍රික්කය - 417.45, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය - 564 ක් වේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ඉඩම් නිදහස් කරන ලද කාල සීමාව අනුව මේ වන විට හෙක්ටයාර 773.62 ක් සංවර්ධනය කර අවසන් වන අතර, ඇතිවූ පාරිසරික ගැටළු හා රටේ පැවති ආර්ථික අවපාතය හේතුවෙන් ඉතිරි හෙක්ටයාර් 182.83 (66.83 +116) සංවර්ධන කටයුතු ප්‍රමාද වී ඇත. එම සංවර්ධන කටයුතු මේ වන විට අවසන් අදියරේ පවතී. ඉන් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයට අයත් ඉතිරි හෙක්ටයාර 116 මොරවැව වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය යටතේ සංවර්ධන කටයුතු සිදු කෙරේ. 1/2016 චක්‍රලේඛනයට අනුව ඉඩම් ලබාදීම ව්‍යාපෘතියේ ඉදිකිරීම් සිදුකරන අවස්ථාවේ සිදුකළ යුතුව තිබුණි. මේ වන විට සංවර්ධනය සඳහා ප්‍රමාණවත් ඉඩම් නිදහස් කර ගැනීමට නොහැකි වීම මත විකල්ප ඉඩම් වෙනුවට රු.මිලියන 1.8 බැගින් ලබා දී මෙම ගැටලුව නිරාකරණය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතුව සිදු කර ඇත. | ව්‍යාපෘතිය ආරම්භ කිරිමට ප්‍රථම බෙදා දීමට අවශ්‍ය විකල්ප ඉඩම් හදුනාගැනිමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පරික්ෂණයක් පවත්වා විනය ක්‍රියාමාර්ග ගත යුතු අතර ගෙවීමට සිදුව ඇති අතිරේක ගෙවීම් සම්බන්ධයෙන් ඔවුන් වගකිව යුතුය.<br>අයවැයෙන් ලැබෙන ප්‍රතිපාදන ඒ ඒ වර්ෂ තුළදීම වැය කිරීම කළ යුතුය. එකම ව්‍යාපෘතිය සඳහා දිගින් දිගට ප්‍රතිපාදන ලබාගැනීම නිසා නව ව්‍යාපෘති හඳුන්වා දීමට නොහැකි වීම සම්බන්ධයෙන්ද අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 972 අතිරේක වන්දි මුදලක් 2025 මාර්තු 27 දින වන විට ගෙවා තිබුණි. | | |
| (ii) | වන්දි ගෙවීමේ ප්‍රමාදවීම හේතුවෙන් අත්පත් කරගත් ඉඩම් සඳහා 38(අ) අතුරු විධිවිධාන ගැසට්කල දින සිට තක්සේරු වාර්තා ලබාදීමේ ප්‍රමාදය මත පූර්ණ වන්දියට අදාළ ව්‍යවස්ථාපිත වන්දිය සඳහා සියයට 7ක පොලී මුදලක් වසර 5 කට වැඩි කාලයක් සඳහා ගෙවීමට සිදුවී තිබුණි. ඒ අනුව 2025 මාර්තු 27 වන දිනට රු.මිලියන 392.53 ක් පොලී වශයෙන් ගෙවා තිබුණි. තවද මෙසේ ගෙවූ පොලිය ඉඩම් අහිමි වූවන් සඳහාම ගෙවූ බවට විගණනයට තහවුරු නොවුණි. | මෙය අදාල ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ කාර්යයක් වන අතර ඔවුන් විසින් කරනු ලබන ඉල්ලීම් අනුව අදාළ වන්දි හා පොලී මුදල් ඔවුන් වෙත ලබා දීම සිදුකරයි. වන්දි ගෙවීම් කටයුතු ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශ මත යොමු කරන ලද වන්දි ඉල්ලීම් ලේඛන අනුව අප විසින් අදාළ ප්‍රතිපාදන ප්‍රාදේශිය ලේකම් වෙත යොමු කරනු ලබන අතර, අදාළ වන්දි ලාභින් වෙත ප්‍රාදේශිය ලේකම් විසින් ගෙවීම් කටයුතු සිදුකරනු ලබයි. ප්‍රාදේශීය ලේකම් විසින් ගෙවීම් කරනු ලබන අයවළුන්ගේ ලේඛන අප වෙත ලබා දෙන මෙන් ඉල්ලුම් කර ඇත. | ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා කරනු ලබන වන්දි ඇතුලු සියලු ගෙවීම් සිදුකිරීමට ප්‍රථම ගෙවීම් කරනු ලබන අයගේ විස්තර ඇතුලත් ලේඛන ලබා ගැනීමට කටයුතු කළ යුතුය.පොලී මුදලක් නොගෙවන පරිදි නොපමාව ඉඩම් ලබා දීමට හා අවශ්‍ය විස්තරාත්මක උපලේඛන පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය.<br>වන්දී ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් ගෙවන ලද පොලී මුදල සඳහා අදාල නිලධාරීන් වගකිව යුතුය. |
| (iii) | නියමිත දිනට ඉඩම් ලබා නොදිම හේතුවෙන් ජලාශයේ වේල්ල ඉදිකිරීමේදී කුඹුරු ඉඩම් අහිමි වූවන් වෙනුවෙන් 2014/2015 යල කන්නයේ සිට 2018/2019 මහ කන්නය දක්වා අක්කරයකට රු. 35,000 බැගින් වගා අහිමි කන්න 8 ක් සඳහා රු.මිලියන 345.45 ක කන්න වන්දි ගෙවා තිබුණි. වම් ඉවුර ඇල ඉදිකිරීමේදී ඉඩම් අහිමි වූවන් වෙනුවෙන් 2018 යල කන්නයේ සිට 2023 මහ කන්නය දක්වා අහිමි කන්න 11 ක් සඳහා අක්කරයකට රු 50,700 ක් හා අහස් දියෙන් වගා කරන ගොවින්ට අක්කරයකට රු 35,000 ක් බැගින් කන්න වන්දි රු. මිලියන 124.91 ක් ගෙවා තිබුණි. ඒ අනුව ඉඩම් අහිමි වූවන්ට නියමිත පරිදි කුඹුරු ඉඩම් ලබා නොදිම නිසා රු. මිලියන 470.36 ක වන්දි ගෙවීමට සිදුවී තිබුණි. මෙසේ ගෙවූ වන්දි ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට ද විගණනයට තහවුරු නොවීමය. | “අදාල සියලු ලේඛන විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත.” ලෙස නිවැරදි නොවන පිළිතුරක් ඉදිරිපත් කර ඇත. | නියමිත දිනයන්ට ලබා දීමට එකඟ වූ වගා ඉඩම් ලබාදීමට නොහැකිවීම පිළිබඳව පරීක්ෂණයක් පවත්වා ඊට වගකිවයුතු නිලධාරීන් හඳුනා ගත යුතුය. ගෙවූ මුදල් ඉඩම් අහිමි වූවන් සඳහාම ගෙවූ බවට තහවුරුවක් විගණනයට ලබාදිය යුතුය. මින් ඉදිරියට මෙවැනි අතිරේක ගෙවීම් වළක්වා ගැනීම සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් හඳුන්වාදීම සඳහා කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | වාරි ඉඩම් ලබා නොදිම හේතුවෙන් ජීවනෝපාය මාර්ග අහිමි වූ පුද්ගලයෙකුට මාසිකව රු.2,000 බැගින් උපරිමය රු. 8,000 දක්වා ජීවනාධාර දීමනාවක් ලෙස 2024 නොවැම්බර් 30 දක්වා රු. මිලියන 505.87 ක් ගෙවා තිබුණි. මේ සඳහා එක් එක් පුද්ගලයන් වෙනුවෙන් ගෙවන ලද ප්‍රමාණය වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි පොත්පත් පවත්වා නොතිබිම හේතුවෙන් ඒ සඳහා දැරූ පිරිවැය ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට විගණනයට තහවුරු කරගත නොහැකි විය. | -එම- | -එම- |

### 4.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ කමිටුවේ **(RAMP)** නිර්දේශ ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ලේකම්ගේ 2022 ඔක්තෝබර් 07 දිනැතිව වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් අමතා ඒ ඒ ව්‍යාපෘති වෙනුවෙන් නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. එම නිර්දේශ හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තා පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය** | | |
| | මෙම ව්‍යාපෘතිය රු.මිලියන 32,397.3 ක ඇස්තමේන්තුවක් යටතේ 2015 වර්ෂයේ ආරම්භ කර වසර 6 කින් නිම කිරීමට සැලසුම් කර තිබුණද එම කාලය තුලදී නිම කර නොතිබුණි. උක්ත ලිපියේ දැක්වෙන පරිදි “මෙම ව්‍යාපෘතිය විදේශ ණය ආධාර සහිත විශේෂ ඉල්ලීමක් නොමැති (Unsolicitted) යෝජනාවකින් ආරම්භ වූ ව්‍යාපෘතියක් වන බැවින් අදාළ අරමුදල් සම්පාදනය පිළිබඳව නිශ්චිත තිරණයක් භාණ්ඩාගාරයෙන් ලැබෙන තෙක් මෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් කිසිවක් ආරම්භ නොකිරිමට කටයුතු කිරිම” ලෙස නිර්දේශ කර තිබුණි. එසේ වුවද ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්පාදනය පිළිබඳව නිශ්චිත තිරණයක් භාණ්ඩාගාරයෙන් | මෙම ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ කමිටු තීරණ අනුව තාවකාලිකව නවතා ඇත. ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සම්බන්ධව දෙනු ලබන උපදෙස් අනුව ඉදිරි කටයුතු කළ හැක. | මෙම ව්‍යාපෘතිය තාවකාලිකව නැවැත්වීමට තීරණය ගන්නා විට ව්‍යාපෘතිය නිම කළ යුතු දිනය පසුවී තිබුණි. ඒ අනුව නියමිත කාලය තුළ ව්‍යාපෘතිය නිම කළේ නම් ව්‍යාපෘතිය තාවකාලිකව නැවැත්වීමේ තීරණයට ඇතුලත් නොවුනු ඇත. එම නිසා මේ සඳහා නිලධාරීන් වගකිව යුතු බැවින් ඔවුනට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය.<br>තවද මේ දක්වා දරන ලද වියදමෙන් ප්‍රතිලාභයක් ලබාගැනීම සඳහා ව්‍යාපෘති කටයුතු නැවත ආරම්භ කිරීමට කටයුතු කල යුතුය. |

වර්තමානය දක්වා ලබාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් 2015 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වැය කල රු.මිලියන 521.54 ක පිරිවැය නිෂ්කාර්ය වී තිබුණි.

**(ආ) කුඩාවිලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීම**

රු. මිලියන 6,000 ක ඇස්තමේන්තුවක් යටතේ මෙම ජලාශයේ ප්‍රතිසංස්කරණයන් 2021 වර්ෂයේ ආරම්භ කර 2023 වර්ෂයේ නිම කිරිමට සැලසුම් කර තිබුණි. උක්ත ලිපිය අනුව නව කාර්මික ජනපද ඉදිකිරිම වෙනුවට දැනට පවත්නා කාර්මික ජනපද පමණක් ඉදිරියට ක්‍රියාත්මක කළ යුතු බවට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බැවින් ඒ අනුව ඔයාමඩුව ඖෂධ නිෂ්පාදන කාර්මික ජනපදය ඉදිරි වර්ෂ දෙක තුළ ක්‍රියාත්මක වන බවට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් තහවුරුවක් ලබා ගැනිමටත්, එසේ නොවන්නේ නම් ව්‍යාපෘතිය නවතා දැම්මටත් කමිටුව නිර්දේශ කර තිබුණි. ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මේ සම්බන්ධයෙන් තහවුරුවක් ලබාගෙන නොතිබුණි. එසේ වුවද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ වලින් එක් ප්‍රතිලාභයක් වූ "අනුරාධපුරයේ යෝජිත ඖෂධ කලාපය සඳහා ජලය සැපයීම" යන්න පමණක් සැලකිල්ලට ගෙන මුළු ව්‍යාපෘතියම නතර කර තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා දරන ලද රු. මිලියන 162.14 ක පිරිවැය නිශ්කාර්යව පැවතිණි.

මෙම ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ කමිටු තීරණ අනුව තාවකාලිකව නවතා ඇත. ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සම්බන්ධව දෙනු ලබන උපදෙස් අනුව ඉදිරි කටයුතු කළ හැක.

අනුරාධපුරයේ යෝජිත ඖෂධ කලාපය සඳහා ජලය සැපයිමට අමතරව ව්‍යාපෘතිය තුළින් ලැබෙන අනිකුත් ප්‍රතිලාභද සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරිමට හා මෙතෙක් දරා ඇති මුදලින් ප්‍රතිලාභයන් ලබාගැනීමට කටයුතු කළ යුතුය.

**(ඇ) මොනරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරි සංවර්ධන ව්‍යාපෘතිය (වෙල්ලස්ස නවෝදය)**

| | | |
|---|---|---|
| රු. මිලියන 2,500 ක ඇස්තමේන්තුවක් යටතේ 2016 වර්ෂයේ ආරම්භ කර 2024 වර්ෂයේ නිම කිරිමට අපේක්ෂිතව මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. උක්ත ලිපියේ දැක්වෙන පරිදි මෙම ව්‍යාපෘතියට අයත් දෙටගමුව වැව ඇතුළු ක්‍රියාත්මක කෙරෙමින් පවතින ඌරාඋල වැව, පයිලේගම වැව හා මොරගොල්ල වැවෙහි ඒ වන විට සිදු කරමින් පැවති ක්‍රියාකාරකම් පමණක් ප්‍රයෝජනයට ගත හැකි පරිදි තිරසාර ලෙස නිම කර ව්‍යාපෘතිය 2022 වර්ෂය තුළ අවසන් කිරිමට නිර්දේශ කර තිබුණ ද එසේ කටයුතු නොකර 2024 වර්ෂයේ සිට ඉදිකිරිම් අත්හැර දමා තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද රු.මිලියන 1,221.21 ක් නිෂ්කාර්යව පැවතිණි. | මෙම ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු තීරණයට අනුව තාවකාලිකව නවතා ඇත. මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස් කරගෙන යෑම සඳහා ප්‍රතිපාදන වෙන්වී නොමැත. | කමිටු තීරණය අනුව පැවති ක්‍රියාකාරකම් ප්‍රයෝජනයට ගතහැකි පරිදි තිරසර ලෙස නිම නොකර අත්හැර දැමීම සම්බන්ධයෙන් ඊට වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතු අතර ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදමින් ප්‍රතිලාභ ලබාගැනීමට වැඩපිළිවෙලක් සකස් කර ගතයුතුය. |

**(ඇ) හිඹිලියාකඩ වත්තේගෙදර වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කිරිම**

| | | |
|---|---|---|
| මෙම ව්‍යාපෘතිය රු. මිලියන 7,155 ක ඇස්තමේන්තුවක් යටතේ 2020 වර්ෂයේ ආරම්භ කර 2024 වර්ෂයේ නිම කිරිමට සැලසුම් කර තිබුණි. උක්ත ලිපියේ දැක්වෙන පරිදි සොරොව්වේ හා වත්තේගෙදර වැව් බැම්මෙහි ඉදිකිරිම් අවසන් කොට ව්‍යාපෘතියෙහි අනෙකුත් ක්‍රියාකාරකම් තාවකාලිකව නවතාලිම ලෙස නිර්දේශ කර තිබුණද එම ඉදිකිරිම් නිම නොකර 2024 මාර්තු මස සිට ඉදිකිරිම් අත්හැර දමා තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂයේ සිට 2024 මාර්තු දක්වා දරන ලද රු. මිලියන 664.40 ක පිරිවැය නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | වත්තේගෙදර වැවේ ඉදිකිරීම් සම්බන්ධයෙන් 2024 අප්‍රේල් 03 දින අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේදී ලබා දුන් උපදෙස් පරිදි ව්‍යාපෘතියේ වැඩ කටයුතු නවතා දමා ඇත. | කමිටු තීරණය අනුව කටයුතු නොකර ව්‍යාපෘතිය අත්හැර දැමීම සම්බන්ධයෙන් ඊට වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතු අතර ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදමින් ප්‍රතිලාභ ලබාගැනීමට වැඩපිළිවෙලක් සකස් කර ගත යුතුය. |

**(ඉ) මහගල්ගමුව පෝෂිත ඇළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

| | | |
|---|---|---|
| 2011 සැප්තැම්බර් 11 දින ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත මහා/ මධ්‍යම පරිමාණ වාරිමාර්ග ව්‍යාපෘති පිළිබඳ දස අවුරුදු සැලැස්ම යටතේ මෙම ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භකර තිබූ අතර ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 500 ක් වි තිබුණි. 2014 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කිලෝමීටර් 14 ක් දිග ඇල මාර්ගයේ තැනින් තැන කැණීම් කිරීම සඳහා රු.මිලියන 374.95 ක් වැය කර තිබූ නමුත් ඇල මාර්ගයේ එක් කොටසක් හෝ නිසි පරිදි සකස්කර නොතිබුණි. 2024 වර්ෂයේ සිට මෙම ව්‍යාපෘතිය අත්හැර දැම්ම නිසා ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම ඵලදායි වියදමක් වී නොතිබුණි. | මේ සඳහා කැබිනට් අනුමැතිය සහ අමතර ප්‍රතිපාදන ලැබෙන්නේ නම් මෙම කාර්යය නිම කිරීමේ හැකියාවක් ඇත. මෙම ව්‍යාපෘතියේ සේවය කළ බොහෝ දෙනෙක් මේ වන විට විශ්‍රාම ගොස් ඇති බැවින් කරන ලද කාර්යයන් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම අසීරු වී ඇත. වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් මෙම ව්‍යාපෘතියේ සිදුවී ඇති වැඩ කටයුතු සම්බන්ධයෙන් කරුණු සොයා බැලීම සඳහා කමිටුවක්ද පත්කර ඇති අතර එහි වාර්තාවද මේ දක්වා ලැබී නොමැත. | වැඩ සැලැස්මකට අනුව සංවර්ධන ව්‍යාපෘතින්හි ඉදිකිරීම් සිදුනොකිරීම , නිමාවකින් තොරව කොටස් වශයෙන් තැනින තැන ඉදිකිරීම් සිදුකිරීම හා වියදම් හඳුනාගත හැකි පරිදි ගිණුම් ගත නොවීම දෙපාර්තමේන්තුවේ පොදු ලක්ෂණයක් බැවින් මෙම අඩුපාඩු නිවැරදි කරගැනීමට වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුය. අමාත්‍යාංශ ලේකම් විසින් පත්කල කමිටුවට මේවන විට වසරක් පමණ ගතවී ඇති බැවින් එම වාර්තාව කඩිනමින් ලබාගැනිමට කටයුතු කර එහි නිර්දේශයන් ක්‍රියාත්මක කිරිමට කටයුතු කර ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට පියවර ගත යුතුය. |

## 4.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්යසාධන වාර්තාවේ 2.3 ඡේදය යටතේ ඉදිරි ඉලක්කයන් දැක්වීමේදී බොහෝ කරුණු යටතේ ඉටු කිරීමට අපේක්ෂා කරන කාර්යභාරය හා ඒවා එක් එක් වර්ෂය තුළ ලඟාකර ගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණයන් දැක්වෙන කාල රාමුවක් ඉදිරිපත්කර නොතිබුණි. | ඉදිරි ඉලක්ක දැක්වීමේදී කරුණු 04 පමණක් ඇතුලත් කර ඇති අතර එම ඉලක්ක 2027 වසර වන විට ළඟා කර ගැනීමට අපේක්ෂා කරන බව දක්වා ඇත. | වාර්ෂික වාර්තාවේ ඉදිරි ඉලක්ක යටතේ ඉටු කිරීමට අපේක්ෂා කරන කාර්යභාරය හා ඒවා එක් එක් වර්ෂය තුළ ලඟාකර ගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණයන් දැක්වෙන කාල රාමුවක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2024 වර්ෂයට ඉදිරිපත්කර තිබූ වාර්ෂික කාර්යසාධන වාර්තාවෙහි කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල 14, ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 52 ක හා යාන්ත්‍රික වැඩපල 14 සඳහා 2024 වර්ෂයේ එක් එක් වැය විෂයන් යටතේ වෙන්කර තිබූ ප්‍රතිපාදන, වියදම හා එමගින් ඉටුකර තිබූ කාර්යයන් දක්වා නොතිබුණි. එබැවින් එක් එක් කාර්යාල මගින් ඉටුකර තිබූ කාර්යයන් තුළින් ලගාකරගත් ජයග්‍රහණ, ප්‍රතිලාභ, අභියෝග හා ප්‍රගතිය විගණනයට තහවුරු කර ගත නොහැකි විය. | මෙම එක් එක් කාර්යාලයට වෙන් කර තිබූ ප්‍රතිපාදනය,වියදම හා එමගින් ඉටු කර තිබූ කාර්යයන් දැක්වීමත්, එක් එක් කාර්යාල මගින් ඉටුකර තිබූ කාර්යයන් මගින් ලගා කර ගත් ජයග්‍රහණ,ප්‍රතිලාභ හා අභියෝග වෙන් වෙන්ව හඳුනා ගත හැකි පරිදි තොරතුරු ඇතුළත් කිරීම ප්‍රායෝගිකව දුෂ්කර වන අතර එය දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාවට ඇතුලත් කළ යුතු බවට මීට පෙර කිසිදු අවස්ථාවක දැනුවත් කර නැත. | එක් එක් කාර්යාල මගින් ඉටුකර තිබූ කාර්යයන් තුළින් ලගාකරගත් ජයග්‍රහණ, ප්‍රතිලාභ හා අභියෝග වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි ප්‍රගතිය සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමට කටයුතු කළ යුතුය. තවද වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් පිළිබඳ තොරතුරු, වෙන් කරනු ලබන ප්‍රතිපාදනද සහිතව වාර්ෂික වාර්තාවේ නිශ්චිතව දැක්වීමට කටයුතු කළ යුතුය. |

## 4.6 ප්‍රසම්පාදනයන්

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.7 ප්‍රකාරව ස්වකීය සේවකයන් සහ උපකරණ භාවිතා කර ඉටු කරන ප්‍රසම්පාදන ක්‍රමය සුදුසු වන්නේ තම ආයතනයේ ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් හා ප්‍රමාණවත් යන්ත්‍ර සූත්‍ර පවතී නම් පමණක් වුවද ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් හා යන්ත්‍ර සූත්‍ර පවතින බව තහවුරු කිරීමකින් තොරව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 6 ක් විසින් ඒවායේ ක්‍රියාත්මක කර්මාන්ත වලින් සියයට 39ක් ස්වකීය සේවකයින් හා උපකරණ භාවිතා කර ඉටුකරන ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ ක්‍රියාත්මක කර තිබුණි. | ඉදිරියේදී සෘජු ක්‍රමය **(Force Account)** භාවිතයට පෙර ස්වකීය මිනිස් බලය හා උපකරණ සම්බන්ධයෙන් තක්සේරුවක් සිදු කොට ඌන ප්‍රමාණය පමණක් කුලී පදනම මත ලබා ගැනීමට කටයුතු කරන ලෙස අදාළ කාර්යාල දැනුවත් කිරීමට කටයුතු කරනු ඇත. | ස්වකීය සේවකයන් හා උපකරණ භාවිතා කර ඉටු කරන ප්‍රසම්පාදන ක්‍රමය යටතේ කර්මාන්ත ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාදීමට ප්‍රථම ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් හා යන්ත්‍ර සූත්‍ර පවතීද යන්න තහවුරු කර ගැනීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | මෙම ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ ශ්‍රමය සපයා ගැනීමේදී අනුගමනය කළ යුතු පටිපාටින්, ඒ සඳහා භාවිතා කළ යුතු ගිවිසුම් ආකෘතින්, පැමිණීම පිටවීම හා කාර්යන් ඉටු කිරීම සම්බන්ධව පවත්වාගත යුතු ලේඛන, ගෙවීම් සිදුකරන පදනම | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් සුදුසු පොදු යාවත්කාලීන නිර්ණායක කාර්යාලවලට නිකුත් කිරීමට බලාපොරොත්තු වේ. | සෘජුශ්‍රම පදනම මත කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේදී සිදු වන අවිධිමත්භාවයන් වැළකෙන පරිදි අනුගමනය කළ යුතු පටිපාටීන් හා භාවිතා කළ යුතු ලේඛනයන්ට අදාළ ආකෘති හඳුන්වා දෙමින් |

| | | | |
|---|---|---|---|
| | අදී කරුණු පිළිබඳ පොදු උපදෙස් හා නිර්ණායක නිකුත්කර නොතිබුණි. මේ හේතුවෙන් එක් එක් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් එම කටයුතු අවිධිමත් ලෙස සිදුකරමින් පැවතුණි. | | අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා චක්‍රලේඛ උපදෙස් නිකුත් කළ යුතුය. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2 වගන්තිය අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අත්පොතෙහි සඳහන් අධිකාරිය විසින් අනුමත කල යුතුව පැවතුනි. එහෙත් රු. මිලියන 15.15 ක ඇස්තමේන්තු වටිනාකමක් සහිත ඒරු වැවේ සිට මහකනදරා වැවට ජලය රැගෙන යන පෝෂිත ඇලේ කිලෝ මීටර් 8+ 650 ස්ථානයේ මූදිරිප්පු වැවේ සිට මහානොච්චිකුලම වැවට ජලය නිකුත්කරන පිටවාන ඉදිකිරීමේදී පස් හා ආස්තරණ ආකෘති වැඩ ඇතුළු මූලික කාර්යයන්, කම්බි වැඩ හා කොන්ක්‍රීට් වැඩ ලෙස කොටස් තුනකට වෙන්කර ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු යටතේ කටයුතු කර තිබුණි. | මේ සම්බන්ධයෙන් ‘පැහැදිලි කිරීමක්’ වාරිමාර්ග අධ්‍යක්ෂ (අනුරාධපුර) වෙතින් ඉල්ලා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර කටයුතු කළ නිලධාරීන් සඳහා විනය පරීක්ෂණ සිදු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4.7 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අලුත්වැඩියා සඳහා යොමුකර තිබූ වාහන හා යන්ත්‍රොපකරණ 45 ක අලුත්වැඩියා කිරීමේ පිරිවැය ඇස්තමේන්තු සකස් කර නොතිබුණ අතර ඇස්තමේන්තු සකස්කර තිබුණ වාහන 32 ක් අලුත්වැඩියා කිරීමට පියවර ගෙන නොතිබුණි. | අමතර කොටස් ආනයනය කර අලුත්වැඩියාවන් සිදු කිරීම මත විනිමය අනුපාතයන් හි අගයන් විචලනය, ප්‍රමුඛතා ලේඛනය අනුව කටයුතු කිරීමට සිදුවීමත් හදිසි අවශ්‍යතා මත ඉන් පරිබාහිර අලුත්වැඩියාවන් කිරීමට සිදු වීමත්, ඇස්තමේන්තු සකස් කිරීම සඳහා කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීමත් බලපා තිබුණි. | අලුත්වැඩියා කටයුතු කාලීනව සිදු කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | **හිඹිළියාකඩ වාරිමාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වැලි මිලදී ගැනිම** | | |
| | විශාල වැලි ප්‍රමාණයක් සැපයීමේදී ප්‍රමාණය මැන ගැනීම සඳහා ගොනු (pile) කිරීම වඩාත් සුදුසු සහ පහසු ක්‍රමවේදය වුවත් මෙම ව්‍යාපෘතිය සඳහා වැලි කියුබ් 1,905 ක ප්‍රමාණය ලෝඩ් කවුන්ටින් ශීට් ක්‍රමවේදය මගින් මැන තහවුරු කර තිබුණ අතර වැලි ප්‍රමාණය මැනීම තාවකාලිකව බඳවාගත් අනියම් කම්කරුවන් මගින් සිදු කරවා ගෙන තිබුණි.<br>මෙම වැලි කියුබ් ප්‍රමාණයෙන් වැලි කියුබ් 788 ක් භාවිතා කිරීමෙන් පසු ඉංජිනේරු සහකාරවරයා භාරයේ පැවතිය යුතු වැලි ප්‍රමාණය කියුබ් 1,117 ක් වුවද 2024 මාර්තු මාසයේදී ව්‍යාපෘතියේ කටයුතු නතර කර මිනිපේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය වෙත පවරා තිබූ අතර එහිදී ඉතිරි වැලි ප්‍රමාණයේ භෞතික තොගය කියුබ් 888 ක් වී තිබුණි. ඒ අනුව ඉංජිනේරු සහකාරවරයා ගේ ද්‍රව්‍ය වාර්තා අනුව පැවති ශේෂයට වඩා රු.මිලියන 3.24 ක වැලි කියුබ් 229 ක් අඩුවී තිබුණි. | වැලි මිලදී ගැනීමේදී ලෝඩ් කවුන්ට් ක්‍රමවේදය අනුගමනය කර ඇති අතර මෙම ස්ථානයට ලොරි රථ මගින් රැගෙන එන වැලි ප්‍රමාණයන්හි උස මැනීමට අනියම් කම්කරුවකු යොදා ගෙන ඇත. මෙම ගණනය කිරීමේදී රැගෙන එන ලද වැලි ප්‍රමාණය හා සංසන්දනය කිරීම කිසිසේත් නිවැරදි නොවේ. මෙය ක්ෂේත්‍රයේ නිලධාරීන් කර ඇති වරදකි. කිසිම ප්‍රායෝගික තත්ත්වයක් අවබෝධ කර නොගෙන එම ගණනය කිරීම සිදු කර ඇත. ප්‍රධාන හේතුව වැලි මිලදී ගැනීමේදී මිනුම් කර ඇත්තේ එක් ක්‍රමවේදයකටත් ඉතිරිව ඇති වැලි ප්‍රමාණය මිනුම් කර ඇත්තේ තවත් ක්‍රමවේදයකටත් වීමයි. මුලදී වැලි මිලදී ගැනීමේදී ලොඩ් කවුන්ට් ක්‍රමය අනුගමනය කර ඇති අතර ඉතිරිවී ඇති වැලි ප්‍රමාණය මැන ඇත්තේ පයිල් මිනුම් (Pile measurement) ක්‍රමය මගිනි. | මෙවැනි විශාල ප්‍රමාණයන් ගෙන් යුත් සැපයීම් ප්‍රමාණයන් මැන ගැනීම සඳහා ගොනු (Pile) කර මිනුම් කිරීමේ ක්‍රමවේදය භාවිතා කිරීම කළ යුතුය. කෙසේ වෙතත් මෙහිදී ගෙවීම් කළ තොග ප්‍රමාණයට සමාන තොග ප්‍රමාණයක් ආයතනයට ලැබිය යුතු බැවින් වැලි ඌනතාවයට වගකිව යුතු නිලධාරීන් තීරණය කිරීම සඳහා පරීක්ෂණයක් පවත්වා අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකළ යුතුය . |

**4.8 කළමනාකරණ දූර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගෙවීම් ක්‍රියාවලිය** | | |
| **(i)** | කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලවලට අනුයුක්ත කර ඇති ගණකාධිකාරීවරුන්ට ගෙවීම් සහතික කිරීමට හැකි, එකී සේවා ස්ථානවලට ආසන්නව පිහිටා ඇති ප්‍රාදේශීය | ප්‍රධාන ගණන්දිමේ නිලධාරි විසින් ගෙවීම් සහතික කිරීම් නිවැරදි ක්‍රමවේදයක් ඇති කිරීමට 2025 පෙබරවාරි 23 දින කමිටුවක් පත් කර තිබු | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ලබා දුන් නිර්දේශය පරිදි ගණකාධිකාරීවරුන් විසින් ඉටුකළ යුතු කාර්යන් ඉංජිනේරු සහකාර සේවයේ |

වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල මොනවාද යන්න සහ එසේ කළ නොහැකි අවස්ථාවන්හිදී ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී වෙත ගෙවීම් සහතික කිරීමේ බලය ලබා දිය හැකි වන කාර්යාල මොනවාද යන්න (ගණකාධිකාරිවරුන් පත්කරන තෙක් තාවකාලික විසඳුමක් ලෙස) පිළිබඳව වාරිමාර්ග අමාත්‍යාංශය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව එක්ව කමිටුවක් පත්කර දීර්ඝ වශයෙන් සාකච්ඡා කර මුදල් අමාත්‍යාංශයද සම්බන්ධ කරගෙන මාසයක් ඇතුළත සුදුසු ක්‍රමවේදයක් සකසන ලෙසත්, ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීමෙන් අනතුරුව චක්‍රලේඛයක් මඟින් ඒ සම්බන්ධයෙන් අදාළ පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස එම චක්‍රලේඛ නිකුත් කිරීමට පෙර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට පිටපතක් යොමු කරන ලෙසත් 2024 අගෝස්තු 07 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී නිර්දේශ ලබාදී තිබූ නමුත් මේ දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද මෙම ගෙවීම් ක්‍රියාවලිය මුදල් රෙගුලාසිවලට පටහැනි බවත් එය නිවරදි කර ගන්නා ලෙසට 2006 අගෝස්තු 25, 2011 මාර්තු 24, 2011 ජුනි 07 හා 2016 සැප්තැම්බර් 22 දිනයන්හි පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවන් විසින්ද නිර්දේශ කර තිබුණි.

අතර 2025 නොවැම්බර් 04 දින රාජ්‍ය ගිණුම් කාරක සභාවේ ලේකම් වෙත එම කමිටු වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙන් ඉවත්කර ගෙවීම් ක්‍රියාවලිය සම්බන්ධව විධිමත් ක්‍රමවේදයක් කඩිනමින් සකස්කර අදාල පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| (ii) | 2011 මාර්තු 24 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝගය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් 2023 නොවැම්බර් 22 දින වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් මගින් රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති අමතා තිබූ ලිපියෙහි 5 වන ඡේදයෙහි දැක්වෙන පරිදි කොට්ඨාශ සහකාරගේ වියදම් සහතික කිරීමේ උපරිම සීමාව රු.මිලියන 02 ක් දක්වා සීමා කර තිබුණි. ඊට වඩා වැඩි වටිනාකමක් සහිත වවුචර්පත් සහතික කිරීම වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ ගණකාධිකාරී විසින් සිදුකළ යුතු බව දක්වා තිබුණි. එසේ වුවද එම සීමාව ද ඉක්මවා යන පරිදි ගෙවීම් සහතික කර තිබුණි. නියැදි පරීක්ෂාවකට අනුව අවස්ථා 12 කදී එසේ රු. මිලියන 02 සීමාව ඉක්මවා ගෙවීම් කළ වටිනාකමෙහි එකතුව රු.මිලියන 43.5 ක් විය. | මේ පිළිබඳව විශේෂ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කළයුතු බවට අදාළ කළාප වාරිමාර්ග අධ්‍යක්ෂවරුන්ට සිහිකැදවීම් හා පිළිතුරු ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දී තිබුණු උපදෙස් වලට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර ඊට වගකිවයුතු නිලධාරින්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |
| **(ආ)** | **අනවසර ඉදිකිරීම් හා වගාකිරීම්** | | |
| **(i)** | 1983 අංක 23 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 2 වගන්තිය ප්‍රකාර 1946 අංක 32 දරන වාරිමාර්ග අඥා පනතේ 65 වන වගන්තියට කරන ලද සංශෝධනය අනුව යම් තැනැත්තෙකු විසින් යම් ඇලක්, ඇල මාර්ගයක්, ජල මාර්ගයක් හෝ වැවක් අවහිර කරන හෝ අයුතු ලෙස අල්ලා ගන්නා හෝ යම් වාරිමාර්ග ඉදිකිරීමකට හානි කරන ලද අවස්ථාවක, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කරනු ලබන යම් කාලයක් ඇතුළත, ඒ අවහිර කිරීම ඉවත් කරන ලෙස හෝ ඒ අයුතු ලෙස අල්ලා ගැනිම නතර කරන ලෙස හෝ ඒ අලාභහානිය අලුත්වැඩියා කරන ලෙස රජයේ ඒජන්ත (Government Agent) විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබීම, නීත්‍යානුකූල විය යුතුය. එසේ දැන්වීමක් භාරදෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් ඒ දැන්වීමේ | දිවයින පුරා විසිරී ඇති වසර දහස් ගණනක් පැරණි වාරිමාර්ග වැඩ වල කාලාන්තරයක් තිස්සේ සිදුවී ඇති ඉඩම් බැහැර කිරීම් හා අනවසර පදිංචි වීම පූර්ණ සමීක්ෂණයක් සිදුකර සිතියම් ගතකිරීමට නම් එකී කරුණ සඳහාම පූර්ණ කාලීනව යෙදීමට හැකි වෙනම සුදුසු පුහුණු නිලධාරීන් පිරිසක් අවශ්‍ය භෞතික සම්පත් සමග අනුයුක්ත කිරීම මෙම සියලු තොරතුරු ලබාගැනීම සඳහා වඩාත් ප්‍රායෝගික හා සුදුසු ක්‍රමවේදය බව යෝජනා කරමි. | අනවසර ක්‍රියාකරකම් සම්බන්ධව වාරිමාර්ග ආඥා පනතේ සඳහන් නියමයන්ට අනුව හා 1983 අංක 23 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 2 වගන්තිය ප්‍රකාර අනවසර ඉදිකිරීම් හඳුනාගෙන කඩිනමින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු අතර නැවත මෙවැනි අවස්ථා ඇති නොවීමට වැඩපිළිවෙලක් දියත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහන් කාලය තුළ එහි වූ නියමයන්ට අනුකූලව එය ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ, පැහැර හරින්නේ නම් හෝ ඒ දැන්වීම භාර දීමේ නියම තැනැත්තා කවුද යන්න ගැන යම් සැකයක් ඇත්නම් වහාම ඒ අවහිර කිරීම ඉවත් කර වීමට හෝ ඒ අයුතු ලෙස අල්ලාගැනීම නතර කරවීමට හෝ ඒ අලාභ හානිය අලුත්වැඩියා කරවීමට රජයේ ඒජන්ත විසින් කටයුතු සැලැස්වීම නීත්‍යානුකූල විය යුතුය.<br>එහෙත් 2025 ඔක්තෝබර් 17 දින ලබා දුන් තොරතුරු අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන වැව්, ජලාශ හා අමුණු 387 න් 123 කට අදාළව පමණක් අනවසර ඉදිකිරීම් 738 ක් හඳුනාගෙන ලිඛිත දැන්විමක් නිකුත් කිරිමට කටයුතු කර තිබුණද 1983 අංක 23 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ (2) හි (2) උපවගන්තිය ප්‍රකාර ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ii) | එක් එක් ජල යෝජනා ක්‍රම, වැව් හා ජලාශ වල රක්ෂිතයේ හෝ වැව් පිටියේ පවතින ඉදිකිරීම්, ව්‍යාපාරික ස්ථාන, ගොඩනැගිලි, වගා කිරීම් පිළිබඳව වෙන් වෙන් වශයෙන් සමීක්ෂණ සිදු කර නොතිබුණ අතර අනවසර ඉදිකිරීම් හා වගා කිරීම් සිදුකර ඇති ස්ථාන හඳුනාගතහැකි පරිදි සීමා මායිම් සළකුණු කර නොතිබුණි. | ක්ෂේත්‍රයේ හඳුනා ගන්නා ලද අනවසර ක්‍රියාකාරකම් වෙනුවෙන් වාරිමාර්ග ආඥා පනත ප්‍රකාරව දැන්වීම් නිකුත් කිරීමත් රජයේ ඉඩම් (සන්තකය ආපසු ගැනීමේ) පනත යටතේ කර නෛතික ක්‍රියාමාර්ගයන්ට එළඹීමත් සිදු කරමින් පවතී.<br>කෙසේ වුවද, දිවයින පුරා විසිරී ඇති වසර දහස් ගනනක් පැරණි වාරිමාර්ග වැඩ වල කාලාන්තරයක් තිස්සේ සිදු වි ඇති ඉඩම් බැහැර කිරීම් හා අනවසර පදිංචි වීම් පූර්ණ සමීක්ෂණයක් සිදු කර සිතියම් ගත කිරීමට නම්, එකී කරුණ සඳහාම පූර්ණ කාලිනව යෙදීමට හැකි වෙනම සුදුසු පුහුණු නිලධාරීන් පිරිසක් අවශ්‍ය භෞතික සම්පත් සමඟ අනුයුක්ත කිරිම මෙම සියලු තොරතුරු ලබා ගැනීම සඳහා | එක් එක් ජල යෝජනා ක්‍රම, වැව් හා ජලාශයන්හි රක්ෂිත සීමාමායිම් සලකුණු කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | වඩාත් ප්‍රායෝගික හා සුදුසු ක්‍රමවේදය බව යෝජනා කරමි. | |

**(ඇ) නිල නිවාස**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | විගණනයට ලබා දුන් තොරතුරුවලට අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් රත්මලාන නිල නිවාසවල පදිංචිව සිට ස්ථාන මාරු වී යාම හේතුවෙන් ඉවත් වීමේ නියෝග නිකුත් කර ඇති නිලධාරීන් 14 දෙනෙකු හා විශ්‍රාම ගොස් සිටි නිලධාරීන් දෙදෙනෙකු 2024 දෙසැම්බර් 30 දින වන විටත් නිල නිවාස ආපසු භාරදී නොතිබුණි. | විගණන වාර්තාවේ නම් සඳහන් අය සඳහා නිල නිවාස භාරදෙන ලෙස දන්වා මේ වන විට ලිපි නිකුත් කර ඇති අතර විශ්‍රාම ගොස් නිල නිවාස භාරදී නොමැති අයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. | අනවසර පදිංචි නිලධාරීන් ඉවත් කිරීමට නීත්‍යානුකූල පියවර ගත යුතුය. |
| (ii) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස නිලධාරීන්ට ලබා දීමේදී එම නිවාස වලට අදාළ කුලී අයකර ගැනීමේදී ආයතන සංග්‍රහයේ දහනව වැනි පරිච්ඡේදයේ 5.2.1 වගන්තියට අනුව විවාහක නිලධාරීන්ගෙන් වැටුපෙන් සියයට 12.5 ක් ද අවිවාහක නිලධාරීන්ගෙන් සියයට 7.5 ක්ද අයකර ගතයුතු වුවත්, බොහෝ නිලධාරීන්ගෙන් එම අගයට වඩා අඩු අගයක් අයකරගෙන තිබුණි. විගණනය විසින් කැඳවන ලද තොරතුරු අනුව මොනරාගල සහ වැල්ලවාය ප්‍රදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයන්හි නිල නිවාසයන්හි නිලධාරීන් 25 කට අදාලව පමණක් ඉහත වගන්තියට අනුව කටයුතු නොකිරීම තුළ වාර්ෂිකව රජයට රු 860,197.56 ක ආදයමක් අහිමි වී තිබුණි. | "නිල නිවාස කුලී සංශෝධනය කිරීම" මැයෙන් සියළුම වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් වෙත දන්වා ඇති අතර ඒ අනුව නව කමිටුවක් පත්කර ඒ සඳහා ඉදිරි කටයුතු කිරීමට පියවර ගනිමින් පවතී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව නිල නිවාස වලට අදාළ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**5. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජලාශවල ධාරිතාවය ඝනමීටර් මිලියන 1,000 කින් 2030 වර්ෂයේදී වැඩිකිරීමට සැලසුම් කර තිබූ නමුත් 2030 වර්ෂය දක්වා එක් එක් වර්ෂවල එම ඉලක්කය ලඟාකරගන්නා | රටේ ඇති වූ ආර්ථික තත්ත්වය මත නව ජලාශ ඉදිකිරීම හා ඉදිකරමින් පැවති ජලාශවල වැඩ කටයුතු නැවැත්වීම RAMP කමිටු | 2030 වර්ෂය දක්වා එක් එක් වර්ෂවල එම ඉලක්කය ලගාකරගන්නා ආකාරය හා එම ප්‍රමාණය වැඩිකරන වැව් හෝ ජලාශ හෝ වාරියෝජනා ක්‍රමය |

| | | |
|---|---|---|
| ආකාරය හා එම ප්‍රමාණය වැඩිකරන වැව් හෝ ජලාශ හෝ වාරියෝජනා ක්‍රමය දක්වා නොතිබුණි. | තීරණ හා NOR කමිටු තීරණ අනුව සිදුවී ඇති බැවින් ධාරිතාවේ ඉහළ යාමක් සිදුවී නොමැත. | දැක්වීමට කටයුතු කළ යුතුය. |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2025 සැප්තැම්බර් 25 දින වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 36 න් තනතුරු 15 ක අනුමත මුළු සේවක සංඛ්‍යාව 19 ක් හා තෘතීය මට්ටමේ තනතුරු 17 න් තනතුරු 10 ක අනුමත මුළු සේවක සංඛ්‍යාව 86 ක් පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් අනුමැතිය ඉල්ලුම් කර ඇත. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |